

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board



NATIONAL LOTTERIES

# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report

# 2024

# පටුන

**01. දළ විශ්ලේෂණය**

සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන් 03
නිෂ්පාදන විෂය ධාරාව 14

**02. විධායක වාර්තා**

සභාපතිගේ සමාලෝචනය 18
සාමාන්‍යාධිකාරීගේ කාර්යසාධන වාර්තාව 20
විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව 21

**03. මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු**

විගණකාධිපතිගේ වාර්තාව 24
ආදායම් ප්‍රකාශය 43
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 43
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 44
ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය 45
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 46
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 47

**04. මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය**

මූල්‍යමය ප්‍රමුඛතාවයන් 81
සමස්ත කාර්යසාධනය 82
නිෂ්පාදන කාර්යසාධනය 84
දස වසරක මෙහෙයුම් සමාලෝචනය 90



# 01 දළ විශ්ලේෂණය

# සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන්

**සංස්ථාමය තොරතුරු**

## ආයතනයේ නම

ජාතික ලොතරැයි මණ්ඩලය

**පිහිටුවන ලද වර්ෂය** - 1963

## නෛතික තත්ත්වය

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. 1997 වසරේදී ඉහත පනත යටතේ ඇති සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත සහ 1998 වසරේදී 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

**ගිණුම් වර්ෂය අවසන් වනුයේ** - දෙසැම්බර් 31

## ලියාපදිංචි කාර්යාලය



| | |
|---|---|
| **ලිපිනය** | : අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01. |
| **කාර්යාලීය වෙබ් අඩවිය** | : www.nlb.lk |
| **දුරකථනය** | : 0114607000/0114607001 |
| **ෆැක්ස්** | : 0114669443/0114669463/0114669475 |
| **විද්‍යුත් තැපැල** | : info@nlb.lk |

## විගණක

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

## බැංකුකරුවන්

මහජන බැංකුව
ලංකා බැංකුව
සම්පත් බැංකුව

## නියාමන ප්‍රතිපත්තීන්

### දර්ශනය

සමස්ත දිවයිනේ සමාජ, ආර්ථික, සංවර්ධනය උදෙසා සෑම ජන කොටසකගේම දායකත්වය තුළින් රාජ්‍ය ආයෝජන නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා.

### මෙහෙවර

සමාජ වගකීම් පෙරදැරිව "පාරිභෝගික විශ්වාසය දිනාගනිමින්" ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිතා කරගනිමින්, නවතාවයෙන් යුතු ලොතරැයි හඳුන්වාදෙමින්, ආශ්චර්යමත් දේශයක් උදෙසා දක්ෂ කැපවූ කාර්යය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවූ අභිමානවත් ආයතනයක්.

### සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

### මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩි දියුණු කිරීම
- පාරිභෝගික සංතුෂ්ඨිය වැඩි කිරීම

### ප්‍රධාන සාරධර්ම

- වගකියන සහ වගකිව යුතු ආයතනයක්
- අවංක සහ විනිවිදභාවයෙන් යුතු ආයතනයක්
- කණ්ඩායම් පරිශ්‍රමය සහ නිපුණත්වය පිළිබඳ විශ්වාසය
- නවීන තාක්ෂණය හා වෙනස් වීමට ඇති අභිරුචිය
- ඉහළම පාරිභෝගික සේවාවක් පිළිබඳ විශ්වාසය

## සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය

### 1 වන කාල පරිච්ඡේදය

**සභාපති**
**වෛද්‍ය චමීර සී. යාපා අබේවර්ධන මහතා**
(2024-09-25 දක්වා)

**කැලුම් ප්‍රියංකර ලියනගේ මහතා**
අධ්‍යක්ෂ
(2024-10-03 දක්වා)

**ආචාර්ය විශාඛා ඩබ්. ඇලපාත මිය**
අධ්‍යක්ෂ
(2024-10-03 දක්වා)

**ආචාර්ය කිත්සිරි මංචනායක මහතා**
අධ්‍යක්ෂ
(2024-10-01 දක්වා)

**නීතිඥ දිනේෂ් විදානපතිරණ මහතා**
අධ්‍යක්ෂ
(2024-10-01 දක්වා)

### 2 වන කාල පරිච්ඡේදය

**සභාපති**
**එම්.ඩී.සී.ඒ. පෙරේරා මහතා**
(2024-09-27 සිට)

**එන්.එස්.එම්.පී. රංජිත් මහතා**
අධ්‍යක්ෂ
(2024-10-07 සිට)

**ආචාර්ය ආර්. රුෂාන්දන් මහතා**
අධ්‍යක්ෂ
(2024-10-25 සිට)

**එම්.පී.ඩී.පී. පතිරණ මිය**
අධ්‍යක්ෂ
(2024-10-07 සිට)

**සී. ගමගේ මහතා**
අධ්‍යක්ෂ
(2024-10-07 සිට)

## ඉහළ කළමනාකරණය

**නීතිඥ හෂිනි ජයසේකර මිය**
SLAS
MA (Sociology)
LLB, BA (Hons)
Notary Public, Commissioner for Oaths
සාමාන්‍යාධිකාරී
(2024-11-04 දක්වා)

**නීතිඥ සංජීව එදිරිසිංහ මහතා**
MBS (Colombo)
අතිරේක සාමාන්‍යාධිකාරී

**ඒ.එම්. අරිෆ් මහතා**
SLAS (Sp. Grade)
සාමාන්‍යාධිකාරී
(2024-11-11 සිට)

**ආචාර්ය හර්ෂ බණ්ඩාර මහතා**
DBA, MBA, FCMA (UK), FCCA (UK),
AMSLIM, FCMA (SL), FCPM, FCAA, CGMA.
ප්‍රධාන මූල්‍ය නිලධාරී
(2024-09-02 දක්වා)

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

**ගීතා පෙරේරා මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් මූල්‍ය)
(2024-11-16 දක්වා)

**කුමුදිනී මඩලුස්ස මිය**
B. Com.Special (1st Class Hons - Peradeniya)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ආදායම් මූල්‍ය)

**නීතිඥ ශ්‍යාමිණි බාලසූරිය මිය**
Notary public & Commissioner for oaths,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
(2024-07-26 දක්වා)

## මධ්‍යම කළමනාකරණය

**මෙනුර චතුරංග මයා**
MBA, BBA
සහකාර සාමාන්‍යාධිකාරී
(අලෙවි)

**ඩී.එස්. වීරරත්න මයා**
MBM, B.Sc. (Special-BM), PCM
CHRM (Readimg)
සහකාර සාමාන්‍යාධිකාරී
(සැපයුම් හා බෙදාහැරීම්)

**ආර්.ඒ. තනූජා සම්මානි මිය**
MFE, BBA (Special-Accountancy)
අභ්‍යන්තර විගණක

**කසුන් කුරුඳුකුඹුර මයා**
MBS, PGDBM, BBA, AMSLIM, MCPM,
AMISMM
සහකාර සාමාන්‍යාධිකාරී
(නියෝජිත කළමනාකරණ)

**ක්‍රිෂාන් ඩී. ජයසිංහ මයා**
MSc (IT & Mgt), B.Sc. (Physical Science)
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

**එන්. චතුර ප්‍රසන්න පෙරේරා මයා**
වරලත් ගණකාධිකාරී
MBA, B.Sc. Accounting (Special)
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
(2024-11-21 දක්වා)

**කේ. ඒ. අචල ජයතිලක මයා**
B. Sc (MIS), DCSD (NIBM),
MBCS, MCSSL, MICS
සහකාර සාමාන්‍යාධිකාරී
(තොරතුරු තාක්ෂණ)

**එච්. එම්. චන්ද්‍රා හේරත් මිය**
BA, ANDHRM
සහකාර සාමාන්‍යාධිකාරී
(පාලන)

**බී. ජී. ඩී. නන්දිකා රෝෂාණි ද සිල්වා මිය**
B.com (Special)
සහකාර සාමාන්‍යාධිකාරී
(මූල්‍ය)

**කපිල සේනානායක මයා**
MBA
සහකාර සාමාන්‍යාධිකාරී
(අලෙවිකරණ)

**ඩී. සුනෙත් ජයවර්ධන මයා**
MBA, BBM (Marketing)
සහකාර සාමාන්‍යාධිකාරී
(ප්‍රසම්පාදන)

## කණිෂ්ඨ කළමනාකරණය (අභ්‍යන්තර)

01. එස්. ඩී. ඒ. විතාන මයා
MIAESL, NDT Auto Eng., IAE ll., CGTTII (Auto), DPHRM, ප්‍රවාහන නිලධාරී

02. ලසන්ත රවීන්ද්‍ර කුමාර මයා
අලෙවි නිලධාරී

03. ධනීෂා ගුණසේකර මිය
MBA, B.com (Accounting & Finance), මූල්‍ය නිලධාරී

04. එම්. ජී. විමුක්ති කෞශල්‍යා මිය
MBS, PG Dip (HRM), CQHRM, PQHRM, AM–CIPM(SL), AM-CIPD(UK), පාලන නිලධාරී

05. එල්. සංජීවනී මිය
MBA, PQHRM, පෞද්ගලික සහකාර

06. ඩී. එම්. ඩී. ලොෂන්දිකා පුෂ්පරාණි මිය
EMSC (Digital Marketing), MA (Mass com), PG Dip. (Human Rights), BA, සන්නිවේදන නිලධාරී

07. ප්‍රියානි හිඟුරුදූව මිය
ත්‍යාග ගෙවීම් නිලධාරී

08. එච්.ඒ. දීපා ප්‍රියංගනී මිය
අයකැමි නිලධාරී

09. නිරෝෂන් විජයවර්ධන මයා
ප්‍රසම්පාදන නිලධාරී

10. එන්. එන්. එම්. ඒ. උපේඛා නිල්ලෙගොඩ මිය
MA (Economics), PG Dip (Economics & Statistics), BA, ANDHRM, මානව සම්පත් නිලධාරී

11. ඒ. එම්. ධනුෂ්ක අත්තනායක මයා
B.com (Special), දිනුම් අදින ලොතරැයිපත් නිලධාරී

12. ශිරානි කළුපහන මිය
බිල්පත් හා ගිණුම් පියවීමේ නිලධාරී (2024-04-29 දක්වා)

13. ජී.වී.ජී. රෝහණ හෙට්ටිආරච්චි මයා
අලෙවි නිලධාරී

14. එස්. එම්. අසංකා සමරතුංග මිය
BA, අලෙවිකරණ නිලධාරී

15. ජේ. එම්. අමිල මධුසංක මයා
NDES (Civil Engineering), Dip EAE, නඩත්තු නිලධාරී

16. ජේ. කේ. ඩී. බුද්ධික ජයනෙත්ති මයා
B.Sc. (Special - Agriculture), ක්ෂණික ලොතරැයි නිලධාරී

17. කේ. එස්. එම්. ප්‍රනාන්දු මයා
PG Dip (MIT), B. Sc. (MIS), HDCBIS(NIBM), DCSD(NIBM), MBCS, MCSS,
පද්ධති පරිපාලක / වැඩසටහන් විශ්ලේෂක

18. සන්ධ්‍යා ප්‍රියානි කොඩිතුවක්කු මිය
M. Bus (Accounting), B. Sc. Financial Management (Special), මූල්‍ය නිලධාරී

19. එස්. එම්. දිලූපා නිල්මිණී ජයවීර මිය
ප්‍රවර්ධන නිලධාරි

20. ඒ. කුමුදිනී ජිනදාස මිය
PGDBFS (CA Sri Lanka), EDABS (CA Sri Lanka), දැන්වීම් නිලධාරි

21. යූ. ජී. එස්. බී. ඩබ්. කැළණි මයා
බෙදාහැරීම් නිලධාරි

22. ඒ. ඒ. ඩී. තනූජා සමන්තිනී මිය
MPA, B.Sc. (Pub. Admin), ANDHRM, LLB (Reading), නියෝජිත කළමනාකරණ නිලධාරි

## කණිෂ්ඨ කළමනාකරනය (ක්ෂේත්‍ර)

01. පි. එන්. ප්‍රගීත් උයන්ගොඩ මයා
B. Sc (Special Mgt. Pub.), කලාප කළමනාකරු

02. කේ. එන්. තාරක ලියනගේ මයා
PG Dip (Marketing Management), කලාප කළමනාකරු

03. බි. චින්තක ගුණරත්න මයා
MA(Economics) Reading, BBA (Special), කලාප කළමනාකරු

04. ප්‍රදීප් රත්නසෝම මයා
BBM (Special - HR), කලාප කළමනාකරු

05. ඒ. මංජුල වන්නිආරච්චි මයා
B. Sc (Special - Marketing), කලාප කළමණාකරු

06. කේ. නෙවිල් දිමුතු මයා
B. Sc (Special - Marketing), කලාප කළමනාකරු

07. එම්. ජී. එල්. රෝහිත සේනාරත්න මයා
BBM (Marketing - Special), කලාප කළමනාකරු

08. කේ.ඒ. හිරෝන් ලසන්ත මයා
Mphil, MA (Mass Com), BA(Hons), කලාප කළමනාකරු

09. ආර්. පි. සරත් ජයනාම මයා
MA (Economics), B. Sc. (Special - BA), B. Sc. Psychology (Reading), Counseling (NUST), MSc. Psychology (Reading), කලාප කළමනාකරු

10. කේ. එල්. ප්‍රියන්ත මයා
B. Com (Special), HND (Industrial Development Management), කලාප කළමනාකරු

11. එම්. එම්. සුමිත් විජේතිලක මයා
PG Dip (BM), B. Sc. (Special – HRM), ADIM(NIBM), CBA(CASL), කලාප කළමනාකරු

12. එම්. එම්. පී. මංජුල කුමාර මයා
BBA (Special - Finance), කලාප කළමනාකරු

13. ඩබ්. ඒ. කේ. පී. විජේරත්න මයා
BBM (Special-Marketing), AMSLIM කලාප කළමණාකරු

14. බි. නුවන් චන්ද්‍රකුමාර මයා
BBM (Special - Marketing), කලාප කළමනාකරු

15. ආර්. ඒ. ගයාන් නිෂාර මයා
BBA (Act special) Degree, කලාප කළමනාකරු

16. ඩබ්. පී. ඩී. කුමාර රාජපක්ෂ මයා
MBM, PG Dip (Marketing), HND Mgt., කලාප කළමණාකරු

17. එස්. කේ. දර්ශන කරුණාතිලක මහතා
BMS (Special – Marketing & Advertising), ESBM, MAAT, කලාප කළමනාකරු

18. ඒ. ඒ. ජී. එස්. වන්නිආරච්චි මයා
BBA (Special - Accounting), කලාප කළමනාකරු

19. ටි. එම්. එස්. ඩී. කුමාර ජයසුන්දර මයා
B. Sc (Appiled Mathematics and Computing), කලාප කළමනාකරු

20. සුන්දරලින්ගම් නරේෂ් මයා
MBA, BBA (Hons) (Special - Financial Management), කලාප කළමනාකරු

21. අයි. තනේෂ් එමර්සන් මයා
BBA, කලාප කළමනාකරු

22. සිවරාජා භාරතන් මයා
B.Eng. (Electronic &Telecommunication), කලාප කළමනාකරු

23. වජිතිලින්ගම් තුවාරගන් මයා
BBA, කලාප කළමනාකරු

24. ජී. ආර්. සී. තිලකරත්න මයා
BA, කලාප කළමනාකරු

25. ඩබ්ලිව්. කේ. ඩී. වෙදගෙදර මයා
PG Dip. (BM), BA (Special - Economics), කලාප කළමනාකරු

# ගමනෙහි ඉතිහාසය හා ප්‍රධාන පියවරයන්

## ගමනෙහි ඉතිහාසය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. 1949 වසරේ එවකට පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබඳ අදහස රජයට ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹිණි.

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි.

## ප්‍රධාන පියවරයන්

### පළමු දශකය - (1963-1972)

1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කිරීම.
1964 ජාතික ලොතරැයි මණ්ඩලයේ පළමු දිනුම් ඇදීම - ටොරින්ටන් චතුරශ්‍රය. (1964-02-20)
1965 පළමුවරට බෙන්ස් මෝටර් රථයක් පිරිනැමීම.
1967 පළමු ශාඛා කාර්යාලය රත්නපුරයෙහි ආරම්භ කිරීම.
1968 ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දීම.
1970 ජාතික සම්පත ලොතරැයිය මහජන සම්පත ලෙසට පරිවර්තනය කිරීම. (1970-07-28)

### දෙවන දශකය - (1973-1982)

1975 සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත අංක 111/1 දරණ ස්ථානයට ප්‍රධාන කාර්යාලය රැගෙන යාම.
1977 ජාතික ලොතරැයියේ මිල ශත 50 - සිට රු.1/- දක්වා වැඩි කිරීම.

### තුන්වන දශකය - (1983 - 1992)

1987 සුපිරි ජාතික ලොතරැයිය හඳුන්වා දීම. (1987-04-11)
1988 මහජන සම්පත ලොතරැයියේ මිල රු. 1/- සිට රු. 8/- දක්වා වැඩි කිරීම.
ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම. (1988 සැප්තැම්බර්)
මහජන සම්පත ලොතරැයියේ ප්‍රථම රූපවාහිනී දිනුම් ඇදීම. (1988-05-10)
1989 මහජන සම්පත ලොතරැයියේ මිල රු.8/- සිට රු.10/- දක්වා වැඩි කිරීම.
1992 එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ආරම්භ කිරීම.

### හතරවන දශකය - (1993-2002)

1994 වාසනා සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.
1995 ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීම.
1996 සමෘද්ධි ලොතරැයිය ආරම්භ කිරීම.
1997 ශ්‍රම වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.
සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කිරීම.
1999 සුපිරි වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.
2000 ජයවිරු ලොතරැයිය ආරම්භ කිරීම.

### පස්වන දශකය - (2003-2012)

2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට මූල්‍ය පහසුකම් සලසාදීම සඳහා සරණ ලොතරැයිය ආරම්භ කිරීම.

සේවක සුභසාධනය සඳහා සුභසාධන හා සකසුරුවම් අරමුදල ආරම්භ කිරීම.

2005 ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙන් (SLIM) සිදුකරන ලද ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී බැංකු හා මූල්‍ය සේවා අංශය යටතේ වඩාත් ජනප්‍රිය වෙළඳනාමය සඳහා වන සම්මානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිවීම.

2006 ලොටෝ ලොතරැයිය අහෝසි කොට සුවසෙත ලොතරැයිය ආරම්භ කිරීම.
ලොතරැයියක් සඳහා මෙතෙක් ගෙවන ලද ඉහළම සුපිරි ත්‍යාගය මහජන සම්පතෙන් පිරිනැමීම. (රු. මිලියන 61.3)

2007 නව ගුවන් තොටුපළ ලොතරැයිය ආරම්භ කිරීම.
එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිල ඩොලර් 25 සිට 50 දක්වා වැඩි කිරීම.

2008 දිනුම් අදින ලොතරැයිවල මිල රු.10/- සිට රු.20/- දක්වා වැඩි කිරීම. (2008-09-02)

2010 ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි දෙකම අහෝසි කර ජාතික සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.
මහජන සම්පත ලොතරැයිය ඉරිදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

2011 ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. බිලියන 10 ක අලෙවි ඉලක්කය පසු කිරීම.
බදාදා දිනුම් අදින ලද ජයවිරු ලොතරැයිය අහෝසි කර එදිනටත් සුපිරි වාසනා සම්පත ලොතරැයිය දිනුම් ඇදීම හඳුන්වා දීම.
නව ගුවන්තොටුපල ලොතරැයිය පැවැත්වීම.
සති තුනක් ඇතුළත රු. මිලියන 10 ට වඩා වැඩි සුපිරි ත්‍යාග 5 ක් පිරිනමන ලද අතර මින් 4 ක් එක දිගට දින 4 කදී සිදුවීම.

2012 සම්පත් රේඛා නමින් නව ලොතරැයියක් හඳුන්වා දීම.
ගොවිසෙත ලොතරැයිය බ්‍රහස්පතින්දා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.
වාසනා සම්පත ලොතරැයිය සඳුදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

### හයවන දශකය - (2013-2022)

2013 ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 10 සිට රු.මිලියන 40 දක්වා වැඩි කිරීම.
සම්පත් රේඛා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු.මිලියන 10 දක්වා වැඩි කිරීම.
ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වන සංවත්සරය වෙනුවෙන් මෙගා 50 නැමති ලොතරැයිය ආරම්භ කිරීම.

2014 පවර් ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම.

2015 අලෙවි සහායකයින් සඳහා දිවිසරණ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. (2015 ජූනි)
නීරෝගා ලොතරැයිය ආරම්භ කිරීම. (2015-07-25)
එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ 31 වෙනි දිනුම් ඇදීම. (2015-08-31)
එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 03ක් පැවැත්වීම ආරම්භ කිරීම. (2015-09-01 සිට)
ප්‍රථම වරට මහත්මා අලෙවි නියෝජිත සම්මාන උළෙල පැවැත්වීම. (2015 දෙසැම්බර්)

2016 බිලියන 20 අලෙවි ඉලක්කය සපුරාලීම.
ඩොලර් ෆෝචූන් ලොතරැයිය ආරම්භ කිරීම. (2016-03-30)
පවර් ලොටෝ ලොතරැයිය අවලංගු කර මෙගා පවර් ලොතරැයිය හඳුන්වා දීම. (2016-05-11)
සුපිරි දෙලක්ෂපති ලොතරැයිය ආරම්භ කිරීම. (2016-05-27)
ජංගම දුරකථන කෙටි පණිවිඩ (SMS) මගින් ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.
ගංවතුරෙන් විපතට පත් ජනතාව සඳහා මනුසත් මෙහෙවර නමින් ලොතරැයියක් ආරම්භ කිරීම. (2016-08-04)
ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වොක්ෂෝල් වීදියෙහි පිහිටි ඉඩමෙහි මුල්ගල තැබීම. (2016-12-01)
ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ටතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ දෙවන ස්ථානය (රිදී සම්මානය) හිමිකර ගැනීම.

2017 මහජන සම්පත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම. බදාදා දින සහ සෙනසුරාදා දින හැර. (2017 මැයි මස සිට).
ගොවිසෙත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම, සිකුරාදා සහ ඉරිදා හැර. (2017 ජූනි මස සිට)
සුපිරි ත්‍යාගය ලෙස නිවසක් පිරිනමන සෙවණ දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම.

ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය 2017-10-26 දින සිට රු.මිලියන 40 සිට රු.මිලියන 60 දක්වා වැඩි කිරීම.

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 04ක් පැවැත්වීම ආරම්භ කිරීම ඉරිදා දින හැර. (2017 ජූලි සිට)

ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ කුසලතා සම්මානයක් හිමිකර ගැනීම.

2017 සැප්තැම්බර් මස පැවැත්වූ සුමති ටෙලි සම්මාන උළෙලේ දී හොඳම ප්‍රචාරක දැන්වීම දෙවන ස්ථානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිකර ගැනීම.

2018 2018 ජනවාරි 01 මස සිට නිෂ්පාදන මිශ්‍රණය වෙනස් වන ලදි.

ගොවිසෙත ලොතරැයිය සතියට දින 5ක් ලෙස පෙර පැවති දිනුම් ඇදීම වෙනුවට සතියේ දින 7 ම දිනුම් ඇදීම ආරම්භ කරන ලදි.

මෙගා පවර් ලොතරැයිය දිනුම් ඇදීම සතියට දින 02 සිට 03 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස ජාතික සම්පත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු.මිලියන 5 සිට රු.මිලියන 10 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස සිට නීරෝගා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු.මිලියන 5 සිට රු.මිලියන 10 දක්වා වැඩි කරන ලදි.

2018 අප්‍රේල් 2 දින ධන නිධානය ලොතරැයිය ආරම්භ කරන ලද අතර ආරම්භක දිනුම් ඇදීම 2018 මැයි මස 25 දින පවත්වන ලදි.

සම්පත් රේඛා හා දෙලක්ෂපති ලොතරැයි අහෝසි කරන ලදි.

2018 ඔක්තෝම්බර් මාසයේදී ජාතික ලොතරැයි මණ්ඩලය නො.32, මුදලිගේ මාවත, කොටුව යන ස්ථානයේ පිහිටි නව ගොඩනැගිල්ල වෙත රැගෙන යන ලදි.

2018 ජනවාරි මස කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ දිනුම් ඇදීම පවත්වන ලදි.

2019 2019-11-14 දින දරු දිරි සම්පත ලොතරැයිය වෙළඳපලට හඳුන්වා දෙන ලදී.

2019-09-06 දින මහජන සම්පත 4000 දිනුම් වාරය (රන්කිරුළ ලොතරැයිය) පවත්වන ලදි.

2020 2020-07-11 දින සිට සුපිරි වාසනා ලොතරැයියේ ත්‍යාග රටාවෙහි වෙනසක් සිදු වූ අතර එහි සුපිරි ත්‍යාගය රු.මිලියන 10 සිට රු.මිලියන 2.5 දක්වා ද ප්‍රථම ත්‍යාගය රු.මිලියන 1 සිට රු.500,000 දක්වා අඩු කරන ලදි.

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 05ක් පැවැත්වීම ආරම්භ කිරීම. (2020 ජූලි 08 සිට)

මහජන සම්පත, ධන නිධානය සහ මෙගා පවර් ලොතරැයිපත් සතියේ දින 7 ම දිනුම් ඇදීම ආරම්භ කරන ලදී.

ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසයේ මෙතෙක් ගෙවන ලද ඉහළම සුපිරි ත්‍යාගය මෙගා පවර් ලොතරැයියෙන් පිරිනැමීම. (රු.මිලියන 236).

2020-09-26 දින මහජන සම්පත ලොතරැයේ 50 වන සංවත්සරය සමරන ලදී.

ලොවපුරා පැතිර යන කොරෝනා වසංගතය ලොතරැයි කර්මාන්තයටද අහිතකර බලපෑමක් ඇති කළ අතර 2020 මාර්තු සිට මාස දෙකක කාලයක් ව්‍යාපාරික කටයුතු නවතා දැමීමට ආයතනයට සිදු විය.

2021 නිෂ්පාදන මිශ්‍රයෙහි පහත වෙනස්කම් සිදු කරන ලදී.

වාසනා සම්පත ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 15 දින සිට හඳුන්වා දෙන ලදී.

ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී.

සුපිරි වාසනා ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 16 දින සිට හඳුන්වා දෙන ලදී.

ත්‍යාග ප්‍රතිශතය 49% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී. 2021 ජූලි 25 සිට දිනුම් ඇදීමේ දින සඳුදා, සෙනසුරාදා සිට අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා ලෙස වෙනස් කරන ලදී.

ජාතික සම්පත ලොතරැයිය - දිනුම් ඇදීමේ දින 2021 අගෝස්තු 02 සිට සඳුදා සහ බ්‍රහස්පතින්දා ලෙස වෙනස් කරන ලදී. මීට පෙර එය බදාදා සහ සෙනසුරාදා විය.

මෙගා පවර් ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 15 සිට හඳුන්වා දෙන ලදී. ඒ අනුව මෙගා සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි ලෙස වැඩි කරන ලද අතර පවර් සුපිරි ත්‍යාගය සහ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 10ක් ලෙස ස්ථාවර කරන ලදී.

දරුදිරි සම්පත ලොතරැයිය - නව ත්‍යාග රටාව 2021 පෙබරවාරි 21 දින සිට හඳුන්වා දෙන ලදී. ඒ අනුව ත්‍යාග ප්‍රතිශතය 47% සිට 52% දක්වා වැඩි කරන ලද අතර පළමු ත්‍යාගය රුපියල් මිලියන 1 සිට රුපියල් 500,000.00 දක්වා අඩු කරන ලදී.

2020 නොවැම්බර් 06 දින අහෝසි කරන ලද නීරෝගා ලොතරැයිය වෙනුවට 2021 පෙබරවාරි 25 දින සිට සම්පත ලග්න වරම ලොතරැයිය හඳුන්වා දෙන ලදී.

**2022** නිෂ්පාදන මිශ්‍රයෙහි පහත වෙනස්කම් සිදු කරන ලදී.

- 2021 ඔක්තෝබර් 28 වන දින සිට සම්පත ලග්න වරම ලොතරැයිය තාවකාලිකව අත්හිටුවන ලදී.
- සුපිරි වාසනා ලොතරැයිය 2022 ජනවාරි 21 සිට තාවකාලිකව අත්හිටුවන ලදී.
- "NLB හඳහන" නමින් නව ලොතරැයියක් 2022 ජනවාරි 27 දින සිට හඳුන්වා දෙන ලදී.
- වාසනා සම්පත ලොතරැයිය 2022 මාර්තු 02 වන දින සිට තාවකාලිකව අත්හිටුවන ලදී.
- සෙවන දිනුම් අදින ලොතරැයිය 2022 මාර්තු 02 වන දින සිට තාවකාලිකව අත්හිටුවන ලදී.
- දරුදිරි සම්පත ලොතරැයිය 2022 මැයි 10 සිට තාවකාලිකව අත්හිටුවන ලදී.
- 2022 ජුනි 3 සිට ජාතික සම්පත ලොතරැයි දිනුම් ඇදීම සතියේ දින හත පුරාම පවත්වන ලදී.

ගොවිසෙත ලොතරැයියේ ත්‍යාග ප්‍රතිශතය 2022 මාර්තු 14 දින සිට 47% සිට 49% දක්වා වැඩි කරන ලදී. ඩොලර් ෆෝචූන් ලොතරැයිය 2022 දෙසැම්බර් 07 වන දින පවත්වන ලද අතර ජයග්‍රාහකයා ඉන්දියානු ජාතිකයෙක් විය. ත්‍යාග ප්‍රතිශතය 2022 ජනවාරි 19 සිට 48% සිට 50% දක්වා වැඩි කරන ලදී.

## වර්තමාන දශකය (2023 - 2032)

**2023** ජාතික ලොතරැයි මණ්ඩලය සිය 60 වැනි සංවත්සරය සමරන ලදී.
2023 ජූලි 6 වන දින සිට සියලුම දිනපතා දිනුම් අදිනු ලබන ලොතරැයි ටිකට්පත් වල මිල රු.20/- සිට රු.40 දක්වා වැඩි කරන ලදී.
60 වැනි සංවත්සරය සැමරීම සඳහා NLB මෙගා මිලියන්ස් (රු.1,000/-) සහ මෙගා 60 (රු.100/-) නමින් විශේෂ ලොතරැයිපත් දෙකක් පවත්වන ලදී.
2023 ජූලි 05 වැනිදා සිට ජාතික සම්පත ලොතරැයිය අහෝසි කරන ලද අතර ජාතික සම්පත ලොතරැයිය වෙනුවට ලකී 7 නමින් නව ලොතරැයිය වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී.
මෙම ලොතරැයිය 2023 නොවැම්බර් 22 දින සිට ලකී 7 ලෙස වෙනස් කරන ලදී.

**2024** අද සම්පත ලොතරැයිය 2024 මාර්තු 21 වන දින සිට හඳුන්වා දෙන ලදී. NLB ජය ලොතරැයිය 2024 දෙසැම්බර් 31 වන දින සිට දියත් කරන ලදී.

# නිෂ්පාදන විෂයධාරාව

## 01. දිනුම් අදින ලොතරැයි

### මහජන සම්පත




**විස්තරය** :
ලොතරැයි වෙළඳපලෙහි පැරණිතම ලොතරැයිය වේ. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රු. මිලියන 20 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2.5 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. ත්‍යාග ප්‍රතිශතය 50%.

**දායකත්වය** :
පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

### ගොවිසෙත




**විස්තරය** :
කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් "ගොවි භාරකාර අරමුදල" ට අරමුදල් උත්පාදනය සඳහා මණ්ඩලය විසින් මෙම ලොතරැයිය 1995 වසරේදී වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රු. මිලියන 60 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. ත්‍යාග ප්‍රතිශතය 49%.

**දායකත්වය** :
පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

### මෙගා පවර්




**විස්තරය** :
මෙම ලොතරැයිය 2016 මැයි මස 11 දින ආරම්භ කරන ලදී. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
පහත සඳහන් පරිදි ප්‍රධාන සුපිරි ත්‍යාග තුනකින් සහ රු.මිලියන 2ක ප්‍රථම ත්‍යාගයක් සහ සිත්ගන්නාසුළු ත්‍යාග.

මෙගා සුපිරි ත්‍යාගය - මිලියන 150 හෝ ඊට වැඩි
පවර් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි
ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි
ත්‍යාග ප්‍රතිශතය 50%

**දායකත්වය** :
පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

## ධන නිධානය




**විස්තරය** :
මෙම ලොතරැයිය 2018 අප්‍රේල් මස 02 දින ආරම්භ කරන ලදී. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රු. මිලියන 80 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ තවත් සිත්ගන්නාසුළු ත්‍යාග.
ත්‍යාග ප්‍රතිශතය 49%

**දායකත්වය** :
පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

## හඳහන




**විස්තරය** :
මෙම ලොතරැයිය 2022 ජනවාරි මස 27 දින ආරම්භ කරන ලදී. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රුපියල් මිලියන 3ක් හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.
ත්‍යාග ප්‍රතිශතය 53%

**දායකත්වය** :
සඳුදා,අඟහරුවාදා සහ බදාදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා රණවිරු සේවා අධිකාරිය වෙත ලබා දී ඇති අතර බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය අතරත් බෙදා දී ඇත.

## ලකී 7




**විස්තරය** :
මෙම ලොතරැයිය 2023 ජුලි මස ජාතික සම්පත ලොතරැයිය වෙනුවට හඳුන්වා දෙන ලදී. 2023 ජුලි 6 වන දින සිට මෙම ටිකට් පතේ මිල රු.20/- සිට රු.40/- දක්වා වැඩි කරන ලදී.

**දිනුම් අදින දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රුපියල් මිලියන 20ක් හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2.5 ක ප්‍රථම ත්‍යාගයක් සහ තවත් සිත්ගන්නාසුළු ත්‍යාග.
ත්‍යාග ප්‍රතිශතය 57%

**දායකත්වය** :
බදාදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට යවා ඇති අතර සෙනසුරාදා සහ ඉරිදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදල හරහා කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයට යවන ලදී. සඳුදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදලට සහ සිකුරාදා දිනුම් ඇදීමේ පිරිවැටුමෙන් 10%ක් ජාතික වකුගඩු අරමුදලට යවන ලදී.

### අද සම්පත



**විස්තරය** :
මෙම ලොතරැයිය 2024 මාර්තු මස21 දින ආරම්භ කරන ලදි. ටිකට් පතෙහි මිල රු.40/-.

**දිනුම් ඇදීන දින** : සතියේ දින හතම.

**ත්‍යාග** :
රු. 250,000.00 ක ප්‍රථම ත්‍යාගයක් සහවෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. ත්‍යාග ප්‍රතිශතය 58%.

**දායකත්වය** :
පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

## 02. ක්ෂණික ලොතරැයි

### සෙවණ



**විස්තරය** :
නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදි. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි. සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර පසුව 1997 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කරන ලදි. ටිකට් පතේ මිල රු.40/- සහ රු.50/-.

**දායකත්වය** :
අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා නිවාස අමාත්‍යාංශයේ ජාතික නිවාස අරමුදලට දායක විය.

### සමෘද්ධි




**විස්තරය** :
සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපැයිමේ පරමාර්ථයෙන් 1996 වසරේදී මෙම ලොතරැයිය ආරම්භ කරන ලදි. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභීන් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත. ටිකට් පතේ මිල රු.50/-.

**දායකත්වය** :
අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදල හරහා සමෘද්ධි හා යෞවන කටයුතු අමාත්‍යාංශයට යොමු කරන ලදි.



# විධායක වාර්තා

# 02

## සභාපතිගේ සමාලෝචනය

මා විසින් රාජකාරි භාරගැනීමෙන් පසු එළඹෙන පළමු මෙහෙයුම් වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2024 තුළින් ඔබ අමතන්නට ලැබීම මා හට ඉමහත් සතුටට කරුණකි.

ලොතරැයි කර්මාන්තයේ පවතින දැඩි තරඟකාරීත්වය මධ්‍යයේ ආර්ථික වෙනස්වීම් වලට මුහුණ දෙමින් ශක්තිමත්ව සහ අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ලොතරැයි වෙළඳපොළ තුළ පුරෝගාමීන් ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය කටයුතු කළේය. ලොතරැයි කර්මාන්තය තුළ දක්නට ලැබෙන අභියෝගාත්මක අවදානම නොතකා අප විසින් රුපියල් බිලියන 37.9 ක පිරිවැටුම් අගයක් සාක්ෂාත් කරගත් බවත් ස්ථාවර ප්‍රගතියක් ලබා ගනිමින් අප ඉතා සාර්ථකව කටයුතු කළ බවත් සාඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි.

**මෙහෙයුම් කාර්යසාධනය**

2023 වර්ෂයේදී සාක්ෂාත් කරගත් රු. මිලියන 32,014.2 ක් වූ පිරිවැටුමට සාපේක්ෂව 2024 වසරේදී එම අගය රු. මිලියන 37,983.2 ක් විය. මෙය රු. මිලියන 5,969ක ඉහළ යාමක් පෙන්නුම් කරන අතර පෙර වසරට වඩා 18.6%ක වැඩිවීමකි. මෙම සමස්ත පිරිවැටුම සමන්විත වන්නේ 99.13%ක් දිනුම් අදින ලොතරැයිපත් මගින් සහ 0.87% ක් සූරන ලොතරැයිපත් මගින් වශයෙනි.

අලෙවිය වැඩිවීම මත පදනම්ව, දැවැන්ත විශ්වසනීය ප්‍රතිඵල සමාජයට ලබාදෙමින් ත්‍යාග, නියෝජිත කොමිස් මුදල් සහ ඒකාබද්ධ අරමුදලට දායකත්වය වැනි සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් වැඩි කරන ලදී.

2023 වර්ෂයේදී ප්‍රකාශයට පත්කරන ලද ත්‍යාග වටිනාකම වූ රු. මිලියන 16,671.4 ක අගය හා සැසඳීමේදී 2024 වර්ෂයේදී එම අගය රු. මිලියන 19,617.6ක් වූ අතර එය රු. මිලියන 2,946.2ක වැඩිවීමකි. මෙම ත්‍යාග මුදල් ගෙවීම යටතේ මණ්ඩලය විසින් වසර ගණනාවක් පුරා සුපිරි ත්‍යාගලාභීන් 41 දෙනෙකු බිහි කළ අතර රුපියල් මිලියන 849.8 ක මුළු මුදලක් ඔවුන් අතරේ බෙදා දෙන ලදී.

එසේම, නියෝජිත ජාලය සඳහා ගෙවන ලද කොමිස් මුදල් ද 2023 වර්ෂයේ රු. මිලියන 6,526.9 ක අගයක සිට සමාලෝචිත වර්ෂයේ 7,596.9ක් දක්වා රු. මිලියන 1,069.5 කින් වැඩි විය. මෙමගින්, අලෙවිය වැඩිවීමේ ප්‍රතිලාභ අලෙවි නියෝජිත ජාලය වෙත ගලා යන බව ප්‍රත්‍යක්ෂ වන අතර, එමගින් ඔවුන්ගේ ආදායම් මට්ටම් ඉහළ නැංවේ.

ඒකාබද්ධ අරමුදල හරහා සෘජුවත්, බදු හරහා වක්‍රවත් රජය විසින් ලබා දෙන ලද මුළු දායකත්වය වන 2023 වර්ෂයේ දී වාර්තා වූ රුපියල් මිලියන 7,311.4 ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී එම අගය රුපියල් මිලියන 8,921.4 ක් වූ අතර එය මිලියන 1,610.0 ක වැඩිවීමකි.

වර්ෂය තුළ මණ්ඩලයේ දළ ලාභය රු. මිලියන 3,044.1 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ එම අගය වූ රු. මිලියන 2,024.4 ට වඩා රු. මිලියන 1,019.7 ක වැඩිවීමකි. 2023 වර්ෂයේ රු. මිලියන 2,502.3 ක් ලෙස දැක්වුණු මෙහෙයුම් වියදම 2024 වර්ෂයේ දී රු. මිලියන 2,289.9 ලෙස කැපී පෙනෙන අඩුවීමක් (9.2% කින්) පෙන්නුම් කර ඇත.

2024 වර්ෂයේදී මණ්ඩලයේ පෙර බදු ලාභය රු. මිලියන 1,693.2 ක් වූ අතර එය 2023 වර්ෂයේ රු. මිලියන 844.8 ක අගය හා සැසඳීමේදී රු. මිලියන 848.4 ක වැඩිවීමකි. සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1,504.2 ක ලාභයක් මණ්ඩලය වාර්තා කළ අතර එය පසුගිය වර්ෂයේ එම අගය වූ රු. මිලියන 650.8 ට වඩා රු. මිලියන 853.4 ක වැඩිවීමකි.

**ඉදිරි වසරේ අපේක්ෂාවන්**

2025 වර්ෂයේදී මණ්ඩලය රු. බිලියන 40.5 ක පිරිවැටුම් අගයක් අපේක්ෂා කරන අතර එය පෙර වසරට වඩා 6.8% ක පමණ වැඩිවීමකි. 2025 වර්ෂයේ අපේක්ෂිත විකිණුම් සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් විශේෂිත උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

ලොතරැයි ක්ෂේත්‍රයේ පවතින තරඟකාරීත්වය නොතකා නව උපාය මාර්ග මගින් ලොතරැයිපත් අලෙවිය තවදුරටත් ශක්තිමත් කිරීමට මණ්ඩලය විසින් සැලසුම් සකස් කරමින් සිටී. අලෙවි නියෝජිත ජාලයේ අලෙවි කුටි වඩා ආකර්ෂණීය පෙනුමකින් යුතුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වැනි රජයේ ආයතන වලද, දේශීය ආයතන වලද උපදේශකත්වය යටතේ සිදු කිරීමට අපේක්ෂිතය. ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය සමඟ මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

නියෝජිත ජාලය යනු ලොතරැයිපත් අලෙවියේ ප්‍රධානතම නියමුවන් වන බැවින් නව විකිණුම් කවුන්ටර, ස්ටිකර් පහසුකම් ආදිය ලබා දෙමින් නියෝජිත ජාලය තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. දැනට නියෝජිතයින් නොමැති ස්ථාන ආවරණය කරමින් පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ.

මණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් ලොතරැයිපත් දියත් කිරීමට මණ්ඩලය අපේක්ෂා කරන අතර ඩිජිටල් ලොතරැයිපත් වැඩි කිරීමට පියවර ගනු ඇත.

**ස්තුතිය පිරිනැමීම**

අප කෙරෙහි විශ්වාසය තබා නිසි මග පෙන්වීම සිදු කිරීම සහ මෙහෙයවීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා සහ මුදල් අමාත්‍යවරයා වෙත මාගේ කෘතඥතාව පුද කර සිටීමට කැමැත්තෙමි. තවද රාජ්‍ය අමාත්‍යවරුන් වෙත ද මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

වසර පුරාම වටිනා උපදෙස් ලබාදුන් ජනාධිපති ලේකම් කර්යාලයේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ටද මාගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමි.

වසර පුරාම ලබාදුන් කාරුණික සහයෝගය පිළිබඳව මණ්ඩලයේ සහෘදයින්ට ද මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

ලොතරැයි වෙළඳපළ තුළ පවතින අභියෝගාත්මක තරඟයට මුහුණ දෙමින් රු. බිලියන 37.9 ක පිරිවැටුමක් සාක්ෂාත් කර ගැනීම පහසු කාර්යයක් නොවේ. මෙම කාර්යසාධනය වාර්තා කිරීමට සියළුම පාර්ශවකරුවන් ඔවුනගේ නොමසුරු සහාය මණ්ඩලය වෙත ලබා දී ඇත. ඒ අනුව, කළමනාකාරීත්වයට සහ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාවය පුද කර සිටිමි, වසර පුරාම අපවෙත ලබාදුන් මිල කළ නොහැකි සහාය වෙනුවෙන් දිස්ත්‍රික් ලොතරැයි බෙදාහරින්නන්, ලොතරැයි අලෙවි නියෝජිතයින් සහ විකිණුම්කරුවන්ගෙන් සමන්විත බෙදාහැරීම් ජාලයට මාගේ ස්තුතිය පුදකර සිටිමි. අපගේ ලොතරැයිපත් කෙරෙහි විශ්වාසය තැබූ පාරිභෝගිකයින් වෙත ද මාගේ කෘතඥතාවය පුදකර සිටින අතර අනාගතයේදී ද ඔවුන් අප සමග රැඳී සිටිනු ඇතැයි අපේක්ෂා කරමි.

එසේම, වඩා යහපත් ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා අපවෙත නොමසුරු සහාය ලබාදුන් විගණකාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද, අභ්‍යන්තර විගණකවරුන්ට ද, බාහිර විගණකවරුන්ට ද, පෞද්ගලික ලොතරැයිපත් විගණකවරුන්ට ද නිසි කලට ටිකට්පත් සැපයීම සඳහා මුද්‍රණ යන්ත්‍ර පරීක්ෂා කිරීම් කටයුතු සිදුකළ සැක කටයුතු ලේඛන පරීක්ෂකවරයාට ද, වසර පුරාම විශිෂ්ට සේවාවක් ලබාදුන් අපගේ ප්‍රධාන බැංකුකරු වන මහජන බැංකුව ඇතුළු අනෙකුත් බැංකු වලටද මාගේ ස්තුතිය පුද කර සිටිමි.

අවසාන වශයෙන්, 2025 වසර තුළ ද මෙම ගමනාතාවය අඛණ්ඩව පවතිනු ඇතැයි අපි අපේක්ෂා කරමු.



එම්.ඩී.සී.ඒ. පෙරේරා
සභාපති
ජාතික ලොතරැයි මණ්ඩලය
2025 පෙබරවාරි 26 වන දින

## සාමාන්‍යාධිකාරීගේ කාර්යසාධන වාර්තාව

දශක හයකට අධික කාලයක් මහජනතාව වෙනුවෙන් මිල කළ නොහැකි සේවයක් සිදුකළ ජාතික ලොතරැයි මණ්ඩලයේ 2024 වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා හට ඉමහත් සතුටට කරුණකි.

මණ්ඩලය විසින් විශේෂිත දිනුම් ඇදීම් වාර කිහිපයකට අමතරව වසර පුරා දිනපතා දිනුම් ඇදීම් වාර හතක් පවත්වන ලදී. 2024 මාර්තු 21 වන දින සිට මණ්ඩලය විසින් දෛනික දිනුම් ඇදීම් වාර ගණන 6 සිට 7 දක්වා වැඩි කරන ලදී. මහජන සම්පත ලොතරැයිය සඳහා වෙළඳපොල තුළ එල්ල වූ තර්ජනය අවම කිරීම සඳහා නිවාරක ක්‍රියාමාර්ගයක් ලෙස අද සම්පත යන නව ලොතරැයි නාමය වෙළඳපොළට හඳුන්වා දෙන ලදී.

**මෙහෙයුම් සමාලෝචනය**

2023 වර්ෂයේ රු. මිලියන 32,014.2 ක් වූ විකිණුම් පිරිවැටුමට සාපේක්ෂව 2024 වර්ෂයේදී මණ්ඩලය රු. මිලියන 37,983.2 ක පිරිවැටුමක් ළඟා කර ගන්නා ලද අතර එය රු. මිලියන 5,969.0 ක කැපී පෙනෙන වර්ධනයක් විය.

රු මිලියන 37,983.2 ක් වූ සමස්ත පිරිවැටුමෙන් රු. මිලියන 37,653.1 ක දායකත්වයක් දිනුම් අදින ලොතරැයිපත් මගින් ලබා දුන් අතර සූරන ලොතරැයිපත් මගින් සමස්ත පිරිවැටුමට ලබා දුන්නේ රු. මිලියන 330.0ක දායකත්වයක් පමණි.

2024 වර්ෂයේදී පිරිවැටුම මත මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට ලබා දුන් සෘජු දායකත්වය (විශේෂ බදු) රු. මිලියන 4,510.1 ක් වූ අතර 2023 වර්ෂයේදී එම අගය රු. මිලියන 3,841.9 ක් විය. මේ අතර රු. 1,060.0 ක විශේෂ බදු මුදලක් ද ඔවුන් විසින් ඉල්ලා සිටි පරිදි ඒකාබද්ධ අරමුදලට ලබා දෙන ලදී. පසුගිය වර්ෂයේදී බදු සමග රජයට ලබා දී ඇති සමස්ත දායකත්වය රු. මිලියන 7,311.6 ක් වූ අතර ප්‍රවර්තන වර්ෂයේදී එම අගය රු. මිලියන 8,921.5 ක් විය.

2023 වර්ෂයේදී රු. මිලියන 6,526.9 ක් වූ නියෝජිත කොමිස් ගෙවීම් හා සැසඳීමේදී 2024 වර්ෂයේ එම ගෙවීම් රු. මිලියන 7,596.5 ක් විය. 2024 වර්ෂයේදී රු. මිලියන 19,617.6 ක මුදලක් ත්‍යාග ලෙස ගෙවා ඇති අතර 2023 වර්ෂයේදී ගෙවූ මුදල රු. මිලියන 16,671.4 ක් විය. විකිණුම් වැඩිවීමට අනුකූලව නියෝජිතායතන කොමිස් මුදල් සහ ත්‍යාග යන දෙකෙහිම කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

2024 වර්ෂයේදී මණ්ඩලයේ අනෙකුත් ආදායම් රු. මිලියන 939.2 ක් විය. 2024 වර්ෂයේදී මණ්ඩලයේ මෙහෙයුම් වියදම විකිණුම් වලින් සියයට 6.0 ක් එනම් රු. මිලියන 2,290.1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අගය විකිණුම් වලින් සියයට 7.8 ක් හෙවත් රු. මිලියන 2,502.3 ක් විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදී මෙම වර්ෂයේ මෙහෙයුම් වියදම රු. මිලියන 212.2 ක වැඩිවීමකි.

2024 වර්ෂයේදී බදු පෙර ශුද්ධ අතිරික්තය රු. මිලියන 1,693.2 ක් එනම් අලෙවිය මත සියයට 4.4ක් වූ අතර 2023 වර්ෂයේදී එම අගය අලෙවිය මත සියයට 2.6 ක් එනම් රු. මිලියන 844.8 ක් ලෙස වාර්තා විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදී මෙම අගය රු. මිලියන 848.4 ක සැලකිය යුතු වැඩිවීමකි. පසුගිය වර්ෂයේදී රු. මිලියන 650.8 ක් වූ මණ්ඩලයේ බදු පසු ලාභය හා සැසඳීමේදී 2024 වර්ෂයේදී එම අගය රු. මිලියන 1,504.2 ක් විය. සමස්තයක් වශයෙන්, 2024 වර්ෂය තුළ විකුණුම් ආදායම සහ බදු පෙර සහ පසු ලාභයට අදාළව වඩා හොඳ ප්‍රතිඵල පෙන්නුම් කරන ලදී.

ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන එහි ප්‍රධාන ව්‍යාපාරය වන ලොතරැයි මෙහෙයුම සහ ආයෝජන මෙහෙයුම ලෙස කාණ්ඩ දෙකකට බෙදා ඇත. මෙම කාණ්ඩ විශ්ලේෂණය මගින් ලොතරැයි මෙහෙයුම් වාර්තා රු. මිලියන 978.0 ක් සහ ආයෝජන මෙහෙයුම් වාර්තා රු. මිලියන 715.2 ක් ලෙස පෙන්නුම් කර ඇත. ලොතරැයි මෙහෙයුම් සඳහා බදු පසු අගය රු. මිලියන 1,003.5 ක් වූ අතර ආයෝජන මෙහෙයුම්වල දායකත්වය රු. මිලියන 500.6 ක් වූයෙන් සමස්ත අගය රු. මිලියන 1,504.2ක් විය.

අනාගත අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සියලු පාර්ශවයන් අප සමඟ අත්වැල් බැඳගනු ඇතැයි මාගේ විශ්වාසයයි.



සාමාන්‍යාධිකාරී
ජාතික ලොතරැයි මණ්ඩලය
කොළඹ
2024 පෙබරවාරි මස 26 වන දින

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

**හැඳින්වීම**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41(2) වගන්තිය අනුව, ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලබන අස්තිත්වයක් තුළ විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. ජාතික විගණන පනතේ 41 වගන්තියට අනුව, සංවිධානයේ පූර්ව නිශ්චය කරගත් අරමුණු සාක්ෂාත් කරගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස හා කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සඳහා මූල්‍ය සහ වත්කම් කළමනාකරණය සහ අස්තිත්වයක් සෑම අංශයක්ම විගණන හා කළමනාකරණ කමිටුව මගින් සමාලෝචනය කරනු ලැබේ.

**විගණන කමිටුවේ සංයුතිය**

අදාළ අධිකාරීන් විසින් අනුමත කරන ලද අදාළ කොන්දේසි වලට අනුකූලව කමිටුව මෙහෙයවන පහත සඳහන් සාමාජිකයින්ගෙන් ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටුව සමන්විත වේ.

1 වන කාල පරිච්ඡේදය

| | | |
|---|---|---|
| ආචාර්ය විශාකා ඩබ්. ඇලපාත මෙය | - | සභාපතිනිය (අධ්‍යක්ෂ - 03.10.2024 දින දක්වා) |
| කැලුම් ප්‍රියංකර ලියනගේ මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ - 03.10.2024 දින දක්වා) |
| දිනේෂ් විදානපතිරණ මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ - 03.10.2024 දින දක්වා) |
| ආචාර්ය කිත්සිරි මංචනායක මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ - 03.10.2024 දින දක්වා) |

2 වන කාල පරිච්ඡේදය

| | | |
|---|---|---|
| ආචාර්ය ආර්. රුෂාන්දන් | - | සභාපති (අධ්‍යක්ෂ - 25.10.2024 දින සිට) |
| සී. ගමගේ මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ - 07.10.2024 දින සිට) |
| එම්. පී. ඩී. පී. පතිරණ මෙය | - | සාමාජික (අධ්‍යක්ෂ - 07.10.2024 දින සිට) |
| එන්. එස්. එම්. පී. රංජිත් මහතා | - | සාමාජික (අධ්‍යක්ෂ - 07.10.2024 දින සිට) |
| රේණුකා කොළඹගේ මහත්මිය | - | නිරීක්ෂක (ප්‍රධාන මූල්‍ය නිලධාරී - අභ්‍යන්තර විගණන, අංශය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය) |
| එල්. කේ. පතිරගේ මහතා | - | විගණන අධිකාරී (රජයේ විගණන ශාඛාව) |
| ආර්. ඒ. තනුජා සම්මානි මහත්මිය | - | අභ්‍යන්තර විගණක (කැඳවුම්කරු) |
| ශ්‍යාමිනි බාලසූරිය මිය | - | ලේකම් (නි. සාමාන්‍යාධිකාරී නීති හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) |

**විගණන කමිටුවේ විෂය පථය**

කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත්, කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලබන අභ්‍යන්තර විගණක සමග රැස්විය යුතු අතර අවශ්‍ය කටයුතු සඳහා වන නිර්දේශ සහිතව එහි නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. කමිටුවේ විෂය පථයට පහත කරුණු ඇතුළත් වේ;

අ) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම.

ආ) ආස්ථිත්‍යයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ඇගයීම්

ඇ) පිරිවැය ඵලදායිතාවය සඳහා ක්‍රමික කාල අන්තරයන්හිදී කාර්යසාධනය සමාලෝචනය කිරීම සහ නාස්ති සහගත වියදම් ආදිය තුරන් කිරීම.

ඈ) බාහිර විගණකවරුන් සමග සම්බන්ධීකරණය වී විගණකාධිපතිවරයාගේ ලිපි අනුව කටයුතු කිරීම.

ඉ) ව්‍යවස්ථාවන්, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛ අනුව කටයුතු කරන බව තහවුරු කරගැනීම.

ඊ) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව කටයුතු කරන බවට සහතික වීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

උ) ප්‍රතිකර්ම සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම්

ඌ) පොදු ව්‍යාපාර කමිටුවේ නිර්දේශ/මගපෙන්වීම් ක්‍රියාත්මක කිරීම සමාලේචනය කිරීම්

**අභයන්තර විගණනය**

අභ්‍යන්තර විගණනය යනු සංවිධානයේ මෙහෙයුම් සඳහා අගය එකතු කිරීමට සහ ඒවා වැඩි දියුණු කිරීමට කළමනාකරණය විසින් නිර්මාණය කරන ලද පරමාර්ථ සහතික කිරීමක් සහ උපදේශාත්මක ක්‍රියාකාරකමකි. අවදානම් කළමනාකරණ සහ පාලන ක්‍රියාවලීන් හි ඵලදායීතාවය ඇගයීම සහ වර්ධනය කිරීම සඳහා ක්‍රමානුකූල සහ විනයානුකූල ප්‍රවේශයක් ලබාදෙමින් සංවිධානයේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එය සහාය වේ.

වාර්ෂික විගණන සැලසුම යනු ජාතික ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණය මෙන්ම විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අවදානම් සහගත විගණන සැලසුමකි. එය ආනුෂංගිකව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරනු ලැබේ.

**2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්සාධනය**

සියලුම ක්‍රියාකාරී අංශයන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නංවන පරිදි ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණන කමිටුව මගින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කරන ලද අතර නිරීක්ෂණය කරන ලද අපගමනයන් මගහරවා ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදෙන ලදී. තවද, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මගින් මතුකොට දක්වා ඇති කරුණු සමාලෝචනය කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමට සහ ගන්නා ලද පියවරයන්හි ප්‍රගතිය අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලදී. 2024 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර විගණන හා කළමනාකරණ කමිටුවේ කටයුතු වලට සහ වගකීම් වලට පහසුකම් සැලසීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් සහ නිරීක්ෂකයින්, ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් ලබාදුන් සහාය සහ දායකත්වය අගය කළ යුතුවේ.

ආචාර්ය ආර්. රුෂාන්දන්
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව
ජාතික ලොතරැයි මණ්ඩලය.
2025 පෙබරවාරි 26 වන දින.



# මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු

# 03

## විගණකාධිපතිගේ වාර්තාව 2024

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඩුආර්/සීඑන්ඩල්සී/ එන්එල්/01/24/41 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 ජුනි // දින

සභාපති
ජාතික ලොතරැයි මණ්ඩලය

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 හි 30 ඡේදයට පටහැනිව තිස් අවුරුදු (30) බදු පදනම් මත ලබාගෙන තිබූ අනුරාධපුරයේ සහ මන්නාරමේ ඉඩම් දෙකේ ඉදිකරන ලද සංචාරක නිවාස දෙක පසුගිය වර්ෂයේ සාධාරණ ආකෘතියට අනුව මිනුම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පිරිවැය ආකෘතිය අනුව හඳුනාගෙන රු.2,485,500 කින් ක්‍රමක්ෂය කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් ගිණුම් ප්‍රතිපත්තිය අඛණ්ඩව භාවිතා කර නොමැති අතර ගිණුම් ප්‍රතිපත්තියේ සිදුකර තිබූ එම වෙනස් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ ද හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් රූපවාහිනී නිවේදක /නිවේදිකාවන් 04 දෙනාකුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවේ විභාග වෙමින් පවතින නඩු 4 ක සහ මණ්ඩලයේ සේවකයකු අනිවාර්ය විශ්‍රාම ගැන්වීම මත කම්කරු විනිශ්චය සභාව විසින් ලබාදුන් තීන්දුවකට එරෙහිව මණ්ඩලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ නඩුවක් සම්බන්ධයෙන් අවසන් තීන්දු 2024 දෙසැම්බර් 31 දක්වා ලබාදී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 40 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ලොතරැයි ත්‍යාග ගෙවීම් ගිණුම් ගත කිරීමේදී ලොතරැයි වර්ග 05 කට අදාළ විශේෂ අංක යටතේ වූ ත්‍යාග ගෙවීම් රු.199,381,719 ක් මණ්ඩලයේ සාමාන්‍ය ත්‍යාග ගෙවීම් රටාව යටතේ ගිණුම් ගත නොකර, පෙර වර්ෂයේ ත්‍යාග සංචිත භාවිතා කර ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 1963 අංක 11 දරන මුදල් පනතේ (4)16 හා 1997 අංක 35 දරන සංශෝධන පනතේ 4(4) සහ (4)5 වගන්තියේ විධිවිධානවලට පටහැනිව 2024 ජනවාරි 01 සිට ජූනි 30 දින දක්වා පවත්වනු ලැබූ ලොතරැයි වර්ග 05 ක මාස 06 ක් ඉක්ම වූ හිමිකම් නොපෑ විශේෂ මුදල් ත්‍යාග රු.76,501,720 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණු අතර එම වටිනාකම් ගෙවිය යුතු වගකීමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර ද නොතිබුණි.

(ඉ) 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ලොතරැයි අලෙවි නියෝජිතයින් විසින් මහජන බැංකුවේ රැස් කිරීම් ගිණුමට තැන්පත් කර තිබූ එකතුව රු. 37,584,371 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම් ගත කිරීමකින් තොරව දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනා නොගත් බැර ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඊ) මණ්ඩලයේ Fortune පරිගණක පද්ධතිය මඟින් ලබාගත් දෛනික ලොතරැයි විකුණුම් ආදායම් වාර්තා සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් දක්වා තිබූ ලොතරැයි විකුණුම් ආදායම්වල රු.119,600 ක අඩුවක් නිරීක්ෂණය විය.

(උ) මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,518,203 ක ණය ශේෂයන් 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු විවිධ ආදායම් ලෙස පෙන්නුම් කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා, මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි, ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන, මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන්, අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ, ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව, ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම්තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි, ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම, උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන්, උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

6

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා, මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2 (ඇ) සහ (ඉ) හි සඳහන් නිර්දේශය හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නියමිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු. 4,040,535,807 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2024 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2019 වසරේ සිට රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) යටතේ කටයුතු කළ යුතු වුවත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ක්‍රමවේදය යටතේ මණ්ඩලයේ කිසිදු ප්‍රසම්පාදනක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | මණ්ඩලය විසින් විවිධ රෝගවලින් පෙළෙන මහජනයාට ප්‍රතිකාර සඳහා අවශ්‍ය අරමුදල් ලබාදීමේ අරමුණින් 1998 වර්ෂයේදී අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර තිබුණි. එම අරමුදලට ලොතරැයි තෑගලාභීන්ගේ පරිත්‍යාගවලින් හා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමාණයක ලැබීම් ලෙස බැර කර තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.21,951,248 ක් විය. මණ්ඩලය විසින් එම අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.17,689,632 ක් වැය කර තිබූ අතර ඉන් රු.16,041,132 ක් එනම් සියයට 90 ක් ඉහත අරමුණට පටහැනි වෙනත් කාර්යයන් සඳහා වැය කර තිබුණි. තවද, මෙලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි. |

8

| | | |
|---|---|---|
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉන්ධන දීමනා හිමිකම් නොමැති පහළ මට්ටමේ කළමනාකරුවන් (JM 1-1) 21 දෙනෙක් සඳහා 2024 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා ලීටර් 110 බැගින් මාසිකව ඉන්ධන දීමනා ප්‍රතිපූර්ණය කර තිබූ අතර නිලධාරීන් 22 දෙනෙක් සඳහා රු.35,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. එසේම කළමනාකරණ සහකාර (MA 1-2) නිලධාරීන් 15 දෙනෙකු සඳහා ලීටර් 25 බැගින් මාසිකව ඉන්ධන දීමනා ප්‍රතිපූර්ණය කර තිබූ අතර, නිලධාරීන් 05 ක් සඳහා රු.6,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. 2024 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා රු.10,690,970 ක් ඉන්ධන දීමනා ලෙස ඉහත නිලධාරීන් වෙත ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක PED 2/2015 සහ 2022 ජනවාරි 18 දිනැති අංක PED 2/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4 වගන්තිය. | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව මණ්ඩලයේ හිටපු සභාපති ඇතුළු නිලධාරීන් 19 ක් වෙත ජංගම දුරකතන 23 ක් සහ i pad 06 ක් ලබාදී තිබූ අතර හිටපු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු වෙත ලබාදී තිබූ රු. 282,657 ක් වටිනා i pad එකක් සහ Macbook එකක් මේ දක්වා මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | |
| | (i) 3.6 වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන පරිදි නැවත ඇනවුම් සිදු කළ හැකි වන්නේ මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ දින සිට මාස 6 ක් ඉකුත් වී නොමැති අතිරේක භාණ්ඩ අවශ්‍යතාවය කලින් නොදුටු සහ හඳුනාගෙන නොතිබුණු විශේෂ අවස්ථාවලදී පමණක් වුවද, මණ්ඩලය විසින් 2019 වර්ෂයේ සිට අවස්ථා ගණනාවකදී ලොතරැයි මුද්‍රණය, සැපයීම, සහ ගෙනවිත් භාර දීමට අදාල ප්‍රසම්පාදනයේ තෝරාගත් සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා ඉහත ප්‍රතිපාදන වැරදි ලෙස අදාල කර ගෙන තිබුණි. |

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

9

| | |
|---|---|
| (ii) 4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය | ඊළඟට එළඹෙන වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දක්වමින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගත යුතු වුවත්, විගණනයට භාජනය කළ 2019 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීමට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. |
| (iii) 4.4 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ එක ප්‍රසම්පාදනයක් යටතේ සිදුකළ හැකිව තිබූ රු.22,974,600 ක් වටිනා අලෙවි සහයක ටී ෂර්ට් 20,000 ක්, රු.3,825,000 ක් වටිනා අලෙවි නියෝජිත ටී ෂර්ට් 3,000 ක් සහ රු.1,386,750 ක් වටිනා කාර්ය මණ්ඩල ටී ෂර්ට් 1,075 ක් මිලදී ගැනීම ප්‍රසම්පාදන 3 ක් යටතේ සිදුකර තිබුණි. |
| (ඇ) 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0199/601/009 හා 2023 පෙබරවාරි 07 දිනැති අංක 123/0199/601/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | රජයේ ආයතනවල නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නීතිඥවරුන්ගේ සේවය පමණක් ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත්, ඊට පටහැනිව මණ්ඩලයට එරෙහිව මුද්‍රණ ආයතනයක් විසින් පවරා තිබූ නඩුවක් වෙනුවෙන් පෙනී සිටීම සඳහා පෞද්ගලික නීතිඥවරු 06 දෙනෙකුගේ සේවය ලබාගෙන ඒ සඳහා රු.5,314,650 ක් වැය කර තිබුණි. |

10

| | | |
|---|---|---|
| (ඊ) | DMS/NLDB/Gen හා 2018 පෙබරවාරි 12 දිනැති NLB ලිපියේ 3.2 ඡේදය. | දිනුම් ඇදීමේ වැඩසටහන් සඳහා සහභාගීවන බාහිර නිවේදක / නිවේදිකාවන් වසර ආරම්භයේ ගිවිසුම්කට එළඹිය යුතු වුවත්, මණ්ඩලය විසින් 2024 වර්ෂය සඳහා තෝරාගත් නිවේදක / නිවේදිකාවන් 18 ක් වෙනුවෙන් එවැනි ලිඛිත ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1963 අංක 11 දරන මුදල් පනත මඟින් ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කර ඇති අතර ඉන් පසු එම පනතේ වගන්ති කීපයක් 1997 සහ 1998 වර්ෂවලදී සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, වර්තමානයේ මණ්ඩලයේ අරමුණුවලට ගැලපෙන පරිදි නව පනතක් කෙටුම්පත් කිරීමට 2017 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/17/0295/719/026 මඟින් අනුමැතිය ලබාදී වසර 8 ක් ගත වී තිබුණද, නව පනතක් සකස් කිරීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) මණ්ඩලය විසින් 2024 ජනවාරි 01 සිට ඉදිරි වසරක කාලයක් දක්වා ලොතරැයිපත් වර්ග 5 ක් මුද්‍රණය කරවාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මණ්ඩලය විසින් ලොතරැයිපත් වර්ග 5 ක් මුද්‍රණය කරවාගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2023 මැයි 29 දින ආරම්භ කර තිබූ අතර අදාළ සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රාත් පිරිනැමීම 2024 ඔක්තෝබර් 15 දින දක්වා වසර 1 යි මාස 4 ක් ගතකර තිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් මීට පෙර එනම් 2023 අප්‍රේල් 01 සිට වසරක කාලයක් සඳහා සිදු කර තිබූ ප්‍රසම්පාදනය සඳහා ද වසර 1 යි මාස 09 ක් ගත කර තිබුණි.

(ii) ප්‍රසම්පාදනයේ එක් එක් පියවරයන් විස්තර කරමින් ඒ සඳහා ගතවන කාලය දක්වමින් ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර එය ප්‍රසම්පාදන කමිටු පළමු රැස්වීමේදී අනුමත කරගත යුතු වුවත්, 2023 මැයි 29 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබූ සහ 2024 අප්‍රේල් 01 දින සිට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නියමිත ලොතරැයිපත් මුද්‍රණය කිරීමට අදාළ ප්‍රසම්පාදනයේ කාල සටහන අනුමත කිරීම 2024 අප්‍රේල් 29 දක්වා ප්‍රමාද කර තිබුණි.

(iii) මණ්ඩලය 2023 මැයි 29 දින ආරම්භ කර තිබූ 2024 අප්‍රේල් 01 සිට ඉදිරියට ලොතරැයිපත් මුද්‍රණය කිරීමට අදාළ ප්‍රසම්පාදනයේ සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය සම්බන්ධයෙන් ආරම්භයේදී මුදල් අමාත්‍යාංශය සමඟ එකඟතාවයක් ඇති කර නොගැනීම නිසා එම ප්‍රසම්පාදනයේ කටයුතු ප්‍රමාද වී තිබුණි. ලොතරැයිපත්වල පිරිවිතර සකස් කිරීම, මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කර ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, තාක්ෂණික පිරිවිතර ඇතුළු ලංසු ලේඛණ අනුමත කර ලංසු කැඳවීමේ ලේඛණ ප්‍රසිද්ධ කිරීම ඇතුළු මූලික වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහා 2024 අප්‍රේල් 30 දින දක්වා වසරකට ආසන්න කාලයක් ගතකර තිබුණි.

(iv) මණ්ඩලයට 2024 අප්‍රේල් 01 දින සිට ලොතරැයි වර්ග 5 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා ප්‍රධාන ප්‍රසම්පාදනය යටතේ සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී පැන නැගී තිබූ ප්‍රමාදය නිසා මාස 3 ක කෙටි කාලයක් සඳහා ලොතරැයි වර්ග 5 මුද්‍රණය කරවා ගැනීමට ආයතන 5 ක් වෙතින් මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. මෙම කෙටිකාලීන ප්‍රසම්පාදනයේ ලංසු ලේඛණවල එක් මුද්‍රණ ආයතනයක් වෙත ප්‍රදානය කිරීමට බලාපොරොත්තුවන උපරිම ලොතරැයිපත් වර්ග ප්‍රමාණය සඳහන් නොකිරීම නිසා ලොතරැයි වර්ග 5 ක් වෙනුවෙන් අවම ලංසු මිල ගණන් ඉදිරිපත් කර තිබූ එක් සැපයුම්කරුවකු වෙත ලොතරැයි වර්ග 2 ක් සඳහා පමණක් මුද්‍රණය කිරීමට තෝරාගැනීම නිසා එම සැපයුම්කරු විසින් මණ්ඩලයට එරෙහිව නීතිමය පියවර ගෙන තිබුණි.

(v) ලොතරැයි වර්ග 5 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන ප්‍රසම්පාදනය මඟින් 2024 අප්‍රේල් 01 දින සිට සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අපේක්ෂාකොළද, එම ප්‍රසම්පාදනය යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම 2024 ඔක්තෝබර් 15 දින දක්වා මාස 6 දින 15 ක් ප්‍රමාද වී තිබුණි. මේ නිසා 2024 අප්‍රේල් 01 සිට මැයි 30 දින දක්වා කෙටි කාලයක් සඳහා වෙනත් ප්‍රසම්පාදනයක් මඟින් සැපයුම් කරුවන් තොරාගෙන පසුව අගෝස්තු 15 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබූ අතර අගෝස්තු 16 සිට ඔක්තෝබර් 15 දක්වා රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙතින් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීමට කටයුතු කර තිබුණි. 2024 අප්‍රේල් 01 දින සිට 2024 ඔක්තෝබර් 15 දක්වා ලොතරැයිපත් මුද්‍රණය කිරීමට වැය වූ පිරිවැය ප්‍රධාන ප්‍රසම්පාදනය යටතේ ලොතරැයිපත් මුද්‍රණය කිරීම සඳහා වැය වන පිරිවැයට සාපේක්ෂව වැඩි වූ අතර ප්‍රධාන ප්‍රසම්පාදනය යටතේ නියමිත දිනට කොන්ත්‍රාත් පිරිනැමීමට නොහැකිවීමෙන් ආසන්න වශයෙන් රු. 48,567,542 ක මුදලක් මණ්ඩලයට වැඩි පුර දැරීමට සිදුව තිබුණි.

(ආ) මණ්ඩලයේ ක්ෂණික (සුරන) ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්ෂණික (සුරන) ලොතරැයිපත් මුද්‍රණය කර සැපයීම සඳහා වසර 03 කට පෙර ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුව 2023 පෙබරවාරි 25 දින අවසන් වී තිබූ අතර 2023 පෙබරවාරි 26 දින සිට නව සැපයුම්කරුවන් තොරාගැනීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 95.9 ක් වූ ප්‍රසම්පාදනය 2022 මාර්තු 24 දින ආරම්භ කර 2024 ජනවාරි 01 දින අවසන් කර තිබූ අතර එම ප්‍රසම්පාදනය සඳහා වසර 1 යි මාස 09 ක් ගත කර තිබුණි.

(ii) 2023 පෙබරවාරි 26 දින සිට ඉදිරියට ක්ෂණික (සුරන) ලොතරැයිපත් මුද්‍රණය කිරීමට සැපයුම්කරුවන් තොරාගැනීම සඳහා වූ ප්‍රසම්පාදනය ප්‍රමාද වීම නිසා එදින සිට අගෝස්තු 25 දක්වා ලොතරැයිපත් මුද්‍රණය කිරීමට කලින් සිටි සැපයුම්කරුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. නව ප්‍රසම්පාදනය යටතේ ලොතරැයිපතක් මුද්‍රණය කිරීමට වැය වන මුදල රු.2.125 ක් වුවත්, එම ප්‍රසම්පාදනය ප්‍රමාදවීම නිසා කලින් ලොතරැයිපතක් මුද්‍රණය කිරීමට වැය වූ රු.2.85 ක පිරිවැය යටතේ සුරන ලොතරැයිපත් 7,500,000 ක් මුද්‍රණය කිරීම නිසා ආසන්න වශයෙන් රු.5,437,500 ක් වැඩි පුර වැය කිරීමට සිදුව තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට යොමුගත ප්‍රසම්පාදන අත්පොතේ 3 සහ 4 අනුව, ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගැනීමට පෙර ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඒ අනුව නියමිත ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගත යුතු වුවත්, 2022 මාර්තු 24 ආරම්භ කර තිබූ සුරන ලොතරැයියක් ප්‍රසම්පාදනයේ ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම පිළිවෙලින් 2022 අගෝස්තු 08 හා දෙසැම්බර් 13 දින සිදුකර තිබූ අතර මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර අනුමැතිය ලබාගැනීම එක් වර්ෂයකට පසුව එනම් 2023 අගෝස්තු 08 දින සිදු කර තිබුණි.

(ඇ) ජාතික ලොතරැයි මණ්ඩලයේ දැන්වීම් ප්‍රචාරණය කිරීම සඳහා ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන පරිදි විධිමත් සැලැස්මකට අනුව කටයුතු කර නොතිබුණු අතර මණ්ඩලය විසින් 2021/2022 වර්ෂයට අදාල ප්‍රසම්පාදන කටයුතු 2021 අප්‍රේල් 01 දිනට පෙර අවසන් කල යුතු වුවත්, එම කටයුතු මාස 11 ක් ප්‍රමාද වීම නිසා තෝරාගත් ආයතන සමඟ 2022/2023 කාලපරිච්ඡේදය වෙනුවෙන් ගිවිසුම් ගත වී තිබුණි. එසේම 2023/2024 සහ 2024/2025 වර්ෂ වෙනුවෙන් ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණු අතර මණ්ඩලයේ අවශ්‍යතාවයට අනුව ඒ ඒ අවස්ථාවේ මිල ගණන් කැඳවා ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීම සිදුකර තිබුණි.

එසේම සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් එකතුව රු. 152,262,162 ක් එක් එක් ලොතරැයි නාම ප්‍රචාරණය වෙනුවෙන් සහ ලොතරැයි මණ්ඩල සන්නාම ප්‍රචාරණය වෙනුවෙන් වැය කර තිබූ අතර ඒ සඳහා ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීමේදී සීමිත ලංසු මිල ගණන් කැඳවා සිදුකර තිබුණි. කෙසේවුවද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උප පරිපූරක 35 හි 2.14.1 වගන්ති අනුව පුනරාවර්තන වියදම් සහ නඩත්තු වැඩ සටහන් සම්බන්ධයෙන් අදාල මුළු වියදම් සැලැකිල්ලට ගෙන අදාළ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකළ යුතු වුවත්, එසේ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අලෙවිකරණ හා ප්‍රචාරණ වියදම් යටතේ සාමූහික සමාජ වගකීම් වියදම් ලෙස වැය කර තිබූ එකතුව රු.8,046,400 ක වියදමක් දක්වා තිබුණි. එම වියදම් යටතේ මණ්ඩලය විසින් පාසල්වල විවිධ ප්‍රසංග ඇතුළු වෙනත් ක්‍රියාකාරකම්වලට, රජයේ ආයතනවල ප්‍රසංගවලට, නාට්‍ය සංදර්ශනයන්, පුහුණු වැඩ සටහන්, පුහුද හමුවෙනුවෙන් සහ ගංවතුර සහනාධාර යනාදී වියදම් වෙනුවෙන් ලබාදුන් මුදල් ඇතුළත් වී තිබුණි. එසේම අවස්ථා 8 කදී වැය කර තිබූ එකතුව රු. 5,212,400 ක් වෙනුවෙන් 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය පරිදි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඉ) 2024 වර්ෂයේ වාහන අළුත්වැඩියා වියදම් ලෙස රු. 32,905,304 ක් වැය කර තිබූ අතර එම වියදම ඉකුත් වර්ෂයේ වැය කළ රු. 19,826,632 ක වියදමට සාපේක්ෂව සියයට 66 කට වැඩි අගයක් වී තිබුණු අතර 2024 වර්ෂයේ වාහන අළුත්වැඩියා සහ නඩත්තු සේවාවන් සිදුකිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට අයදුම්පත් කැඳවීම 2023 නොවැම්බර් 17 දින සිදු කර තිබුණද, සැපයුම්කරුවන් තෝරාගැනීම 2024 ජූලි 31 දක්වා මාස 7 ක පමණ කාලයක් ගත කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේ ආරම්භයේ සිට එම සේවා ලබාගැනීමට හැකිවන පරිදි සැපයුම් කරුවන් ලියාපදිංචි කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

එසේම මණ්ඩලය විසින් වාහන අළුත්වැඩියා වියදම් සිදු කිරීමේදී තරඟකාරී ලංසු කැඳවීමක් මගින් හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 හෝ 3.6 අනුව ක්‍රියා නොකර ඊට පටහැනිව අළුත්වැඩියාව වියදම් රු.100,000 ක් දක්වා සහ ටයර්,ටියුබ්, බැටරි ඇතුළු වියදම් සඳහා රු.200,000 දක්වා සිදු කිරීම සඳහා මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් යටතේ ලබාගත් බලය බෙදාහැරීමක් මගින් සෘජු මිලදීගැනීම් ලෙස, කිරීම සඳහා අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඊ) මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයින් වෙත ලබාදීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 75.25 ක් වූ අලෙවි කුටි 300 ක් මිලදී ගැනීම සඳහා 2023 දෙසැම්බර් 20 දින කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර මෙම ප්‍රසම්පාදනයේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 හි සඳහන් විධිවිධාන අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු කැඳවීමකින් තොරව තනි ආයතනයක් වෙතින් ලබාගත් ලංසුවක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

එසේම අලෙවි කුටි මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී අලෙවි කුටි නිෂ්පාදනය කිරීම, සන්නාම කිරීම සහ බෙදාහැරීම තනි ප්‍රසම්පාදනයක් යටතේ සිදුනොකර අලෙවි කුටි නිෂ්පාදනය කිරීම සහ සන්නාම කිරීම වෙන් වෙන්ව ප්‍රසම්පාදන දෙකක් යටතේ සැපයුම්කරුවන් දෙදෙනෙකු වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) සහ 8.9.3 ඡේදයවල විධිවිධාන පරිදි අලෙවි කුටි නිෂ්පාදනය කිරීමට තෝරාගත් ආයතනය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



## 2.3 වෙනත් නිරීක්ෂණ

(අ) මණ්ඩලය විසින් කුළියට ගත් ගොඩනැගිල්ලක සිය කාර්යාලය පවත්වාගෙන යන අතර වර්තමානයේ සිටින ස්ථානය 2018 වර්ෂයේ සිට කුළියට ගෙන තිබුණි. මණ්ඩලයේ කාර්යාල ඉඩ අවශ්‍යතාවය ව.අ. 40,000 ක් පමණ වුවත්, කුළියට ගෙන ඇති ගොඩනැගිල්ලේ ප්‍රමාණය ව.අ. 28,885 ක් විය. එසේම වසර 2 ක් සඳහා පමණක් කුළියට ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබියදී එම කාලසීමාව ඉක්මවා වසර දෙකෙන් දෙකට කුළී ගිවිසුමේ කාලය දීර්ඝ කර කුළියට ගෙන තිබූ අතර මණ්ඩලයේ අවශ්‍යතාවයට ගැලපෙන වෙනත් ගොඩනැගිල්ලක් සපයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි. තවද, මණ්ඩලය විසින් අත්තිකාරම් බදු කුළී ලෙස රු.63,329,175 ක් සහ ජල, විදුලි සහ දුරකථන බිල්පත් වෙනුවෙන් රු.24,329,175 ක් ලෙස එකතුව රු.87,658,350 ක අත්තිකාරම් 2 ක් වසර 7 කට අධික කාලයක සිට තැන්පතුවක් ලෙසින් එම ගොඩනැගිල්ලේ හිමිකරු වෙත ලබාදී තිබෙන අතර අයිතිකරුට ගෙවන මාසික ගොඩනැගිලි කුළියෙන් කොටස් වශයෙන් ඉහත අත්තිකාරම් මුදල අඩුකර ගැනීමේ එකඟතාවයක් ඇති කර නොගැනීම නිසා අතිරේක ප්‍රතිලාභයක් හිමිකරු වෙත ලබාදී ඇති බවට නිරීක්ෂණය විය.

එසේම මණ්ඩලය විසින් 2009 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.මිලියන 500 ක් වටිනා පර්චස් 112.5 ක් වූ කොළඹ වොක්ෂෝල් මාවතේ පිහිටි ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන එහි නිර්මාණ සැලැසුම් වෙනුවෙන් රු.27,003,862 ක් වැය කර තිබුණි. එමෙන්ම මණ්ඩලය විසින් මෙම ගොනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ආරම්භ කර තිබූ ගොඩනැගිලි සංචිත අරමුදලින් රු.මිලියන 1,500 ක් මහා භාණ්ඩාගාරය වෙත ලබාදී නිර්මාණ සැලැසුම් වෙනුවෙන් ආරම්භයේ වැයකර කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ඉහත ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන සිදුකර ගොඩනැගිල්ල ඉදිකිරීම අත් හැර දමා තිබුණි. කාර්ය මණ්ඩලය 350 කට අධික සංඛ්‍යාවක් සිටින සහ රථවාහන 50 කට අධික සංඛ්‍යාවක් ඇති මෙම ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොතිබීම නිසා ව්‍යාපාර ස්ථානය නැතින් තැනට මාරු කිරීමට හා ගොඩනැගිලි කුළී ලෙස විශාල පිරිවැයක් වැය කිරීමට සිදුව තිබුණි.

(ආ) මණ්ඩලයේ මෙහෙවර වශයෙන් සමාජ වගකීම් පෙරදැරිව පාරිභෝගික විශ්වාසය දිනාගනිමින් ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිතා කරමින් නවාංගතාවයෙන් යුතු ලොතරැයි හඳුන්වාදෙමින් ආශ්චර්යමත් දේශයක් උදෙසා කැපවූ කාර්යය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවූ ආයතනයක් ලෙසින් දක්වා තිබුණි. මණ්ඩලය විසින් නව තාක්ෂණය හා අන්තර්ජාලය උපයෝගී කර ගනිමින් මාර්ග ගත ලොතරැයිපත් හඳුන්වා දීම 2016 දී ආරම්භ කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මණ්ඩලය විසින් අන්තර්ජාලය උපයෝගී කර ගනිමින් මාර්ග ගත ලොතරැයිපත් හඳුන්වා දී මේ වන විට වසර 8 ක් ගතවී ඇතත් සමස්ථ අලෙවි ආදායමෙන් සියයට 1.1 ක් වූ සීමිත වෙළඳපොළ කොටසක් පමණක් මේ දක්වා අත්පත් කර ගෙන තිබුණි.

(ii) වර්තමාන සමාජයේ පුද්ගලයන් බොහොමයක් භෞතික වෙළඳපොළින් ඉවත් වී මාර්ග ගත වෙළඳපොළ වෙත යොමුවීමේ ප්‍රවනතාවයක් පවතින බැවින් මාර්ග ගත ලොතරැයිපත් අලෙවිය වර්ධනය කර ගැනීමට අපොහොසත් වුවහොත් ඉදිරියේදී මණ්ඩලයේ ලොතරැයිපත් අලෙවිය අඩුවීමේ අවදානමක් තිබුණද, ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. 2020 දෙසැම්බර් 04 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ කර තිබූ මාර්ග ගත ක්‍රමයට ලොතරැයිපත් අලෙවිය සඳහා පවතින වෙළඳපොළ අවස්ථා හඳුනාගැනීම සඳහා වෙළඳපොළ සමීක්ෂණයක් මේ දක්වා සිදුකර නොතිබුණු අතර 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මාර්ග ගත ලොතරැයි ප්‍රවර්ධනය වෙනුවෙන් ඇතුළත් කර රු. මිලියන 10 ක් සඳහා ප්‍රමාණවත් වැඩ සටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) 2023 ජුනි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලසීමාවේ මාර්ග ගත ක්‍රමය යටතේ ලොතරැයිපත් අලෙවි කිරීම සඳහා ලොතරැයිපත් 67,438,400 ක් වෙන් කර තිබුණද, ලොතරැයිපත් 17,482,240 ක් එනම් සියයට 26 ක් පමණක් අලෙවි නියෝජිතයින් වෙත නිකුත් කර තිබුණි. එමෙන්ම එම නිකුත් කළ ප්‍රමාණයෙන් ලොතරැයිපත් 6,096,005 ක් අදාළ අලෙවි නියෝජිතයින් විසින් ආපසු එවා තිබුණි. ඒ අනුව අදාළ කාලපරිච්ඡේදයේ මාර්ග ගත ක්‍රමය යටතේ වෙන් කර තිබූ ලොතරැයි ප්‍රමාණයෙන් සියයට 83 ක් වැනි විශාල ප්‍රමාණයක් අලෙවි වී නොතිබුණි. මාර්ග ගත ක්‍රමය යටතේ ජංගම දුරකථන මගින් ලොතරැයිපත් මිලදීගන්නා පාරිභෝගිකයින්ට සාමාන්‍ය ලොතරැයිපතක් මිලට ගැනීමේදී ගෙවන මිලට අමතරව රු. 8 ක වියදමක් දැරීමට සිදුවීම නිසා එම ලොතරැයිපත් මිලදී ගැනීම අධෛර්යමත් වී තිබුණද, ඒ පිළිබඳ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

17

(ඇ) මණ්ඩලය විසින් 2023 ජුලි 06 දින සිට එකෙක් රු.20 ට අලෙවිකල ලොතරැයිපත් මිල රු.40 ක් දක්වා සියයට 100 කින් වැඩිකර තිබුණි. ලොතරැයි මිල වැඩි කිරීමට පෙර ආසන්න වර්ෂය තුළ අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමාණය 1,298,009,942 ක් වූ අතර මිල වැඩි කිරීමෙන් පසු 2024 වර්ෂය තුළ අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමාණය 821,763,940 ක් විය. ඒ අනුව මිල වැඩි කිරීමෙන් පසු අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමාණය 476,246,002 කින් හෙවත් සියයට 37 කින් පහත වැටී තිබුණි. ලොතරැයිපත් මිල වැඩි කර වසරකට වැඩි කාලයක් ගතවී ඇතත්, මිල වැඩිකිරීමට පෙර පැවැති පාරිභෝගික කොටස නැවත අත්කර ගැනීමට මණ්ඩලයට මෙම දක්වා නොහැකි වී තිබුණි.

(ඈ) ලොතරැයිපත් මිල වැඩි කිරීමට සාපේක්ෂව දෛනිකව අලෙවි වන ලොතරැයිපත් ප්‍රමාණය පහත වැටීම නිසා දෛනික දිනුම් ඇදීම් මඟින් පිරිනැමෙන තෑගි ප්‍රමාණයද සැලකිය යුතු ලෙස පහත වැටී තිබුණි. ඒ අනුව මිල වැඩි කිරීමට පෙර මාස 6 ක් තුළදී ලොතරැයිපත් වර්ග 5 කින් සුපිරි තෑග 42 ක් පාරිභෝගිකයින් වෙත පිරිනමා තිබුණද, මිල වැඩි කල පසුව මාස 6 ක් තුළ පිරිනමා තිබූ සුපිරි තෑග සංඛ්‍යාව 16 ක් විය. ඒ අනුව පාරිභෝගිකයින් වෙත පිරිනමා තිබූ සුපිරි තෑග සංඛ්‍යාව සියයට 62 කින් පහත වැටී තිබුණි. එමෙන්ම ඉහත කාලපරිච්ඡේදයේ මිල වැඩි කිරීමට පෙර ලොතරැයි වර්ග 5 ක ප්‍රථම තෑග පිරිනැමීම් 595 ක් වූ අතර මිල වැඩි කළ පසුව එම තෑග පිරිනැමීම් සංඛ්‍යාව 297 ක් දක්වා සියයට 50 කින් පහත වැටී තිබුණි. එසේම ඉහත කාලපරිච්ඡේදයේ මිල වැඩි කිරීමට පෙර ලොතරැයි වර්ග 5 ක මුළු තෑග පිරිනැමීම් සංඛ්‍යාව 157,053,566 ක්වූ අතර මිල වැඩි කළ පසු මුළු තෑග පිරිනැමීම් සංඛ්‍යාව 93,587,379 දක්වා සියයට 40 කින් පහත වැටී තිබුණි. මේ අනුව මිල වැඩිකල පසුව පාරිභෝගිකයින්ට දිනාගැනීමට හැකි තෑග සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩුවී තිබුණද, ඒ පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් 2015 අප්‍රේල් 01 දින සිට 2017 මාර්තු 31 දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඇතිකර ගත් රක්ෂණ ගිවිසුමක් යටතේ ආපදාවලදී ප්‍රතිලාභ ලෙස අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට පිළිවෙලින් රු.2,249,000 සහ රු.2,453,000 ක් ගෙවා තිබුණි. කෙසේවුවද, 2017 මාර්තු 31 දිනෙන් පසුව මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම ප්‍රතිලාභ වැඩ සටහන රක්ෂණ යෝජනා ක්‍රමයක් ලෙස වැරදි ලෙස හඳුන්වා දෙමින් සෘජුවම මණ්ඩලය මඟින් සිදුකරමින් කරමින් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කලාප කරුවන්ගේ නිර්දේශ මත රු.14,871,500 ක් ආපදා ප්‍රතිලාභ ලෙස අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට ලබාදී තිබූ අතර මෙම ප්‍රතිලාභ ලබන අලෙවි සහයකයින්ගේ තොරතුරු මණ්ඩලය සතුව නොමැති බැවින් ප්‍රතිලාභ ලබාදීමේදී අක්‍රමිකතා සිදුවීමේ අවදානමක් නිරීක්ෂණය විය.

(ඊ) 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් 04 ක් හැර අනෙකුත් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 92 ක් හා SMS මඟින් ලොතරැයිපත් අලෙවි කරන අලෙවි නියෝජිතයින් 04 ක් වෙත රු.1,35,477,704 ක පැසිව් ලොතරැයිපත් ණයට අලෙවිකර තිබුණද, ඉන් ණයගැතියන් 55 ක් වෙතින් පමණක් රු.77,125,000 ක බැංකු ඇපකර ලබාගෙන තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් හැර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 41 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරකුම් ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර ඔවුන් වෙතින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.58,036,119 ක් අය විය යුතුව තිබුණි.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පැසිව් ලොතරැයි ණයගැති ශේෂයෙන් එකතුව රු.9,597,376 ක් මාස 03 ක් ඉක්මවා හිඟව පවතින අතර එම ණයගැතියන් විසින් බැංකු ඇපකර හෝ වෙනත් සුරක්ෂිතයක් ලබාදී නොතිබුණි.

(ඌ) බැංකු ඇපකර ලබාදී තිබූ පැසිව් ලොතරැයි අලෙවි නියෝජිතයින් 30 ක් වෙත එකී බැංකු ඇපකර වටිනාකම ඉක්මවා ණයට විකුණුම් සිදුකර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඇපකර වටිනාකම ඉක්මවා රු.21,131,129 ක විකුණුම් සිදුකර තිබුණි.

(එ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට සෙවන, සම්පූර්ධි හා විශේෂ ලොතරැයි අලෙවියට අදාළ වෙළඳ ණයගැතියන් 31 ක් වෙතින් ලැබිය යුතු රු.12,689,821 ක් සඳහා බැංකු ඇපකර හෝ වෙනත් සුරැකුමක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම ඉහත ඇප කර ලබාගෙනත් අලෙවි නියෝජිතයින් 10 ක් වෙතින් අයවිය යුතු රු.6,602,693 ක් වසර 05 ක් ඉක්මවා හිඟව පැවැතින අතර එම හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) මණ්ඩලයේ සුභ සාධක සංගමය වෙත සහ කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වෙත ණය පදනම මත අලෙවි කර තිබූ සෙවන, සම්පූර්ධි හා විශේෂ ලොතරැයි අලෙවියට අදාළ රු.1,086,759 ක් වසර 5 ක් ඉක්මවා හිඟව පවතින අතර අදාළ හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවට නිරීක්ෂණය විය.

(ඔ) මණ්ඩලයේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට ඩොලර් ෆෝචූන් ලොතරැයියෙන් රු.964,678 ක් 2022 වර්ෂයේ සිට හිඟව පවතින අතර කොළඹ එයාපෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයියෙන් රු.4,150,280 ක් 2018 ජනවාරි 21 දින සිට හිඟව පවතින නමුත් එම හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවට නිරීක්ෂණය විය.

(ඕ) මණ්ඩලයේ සේවය කළ නිලධාරීන් 5 ක් වෙත ලබා දී තිබූ ආපදා ණය මුදල්වලින් එකතුව රු.713,393 ක් වූ ණය ශේෂ 2012, 2017, 2018 සහ 2019 වර්ෂවල සිට ආපසු ගෙවීම සඳහා අදාළ නිලධාරීන් විසින් පැහැර හැර තිබුණද, එම අයවිය යුතු ණය ශේෂ 2024 දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ක) මණ්ඩලයේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ නිවාස ණය මුදල්වලින් එකතුව රු.1,519,920 ක්වූ ණය ශේෂ 2006 වර්ෂයේ සිට සහ 2016 වර්ෂයේ සිට ආපසු ගෙවීම සඳහා අදාළ නිලධාරීන් විසින් පැහැර හැර තිබුණද, 2024 දෙසැම්බර් 31 දක්වා එම අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ග) විගණනය විසින් 2024 ඔක්තෝම්බර් 11 වන දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලබාගන්නා ලද තොරතුරු අනුව, මණ්ඩලය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ මෝටර් කාර් රථ 05 ක් සහ මෝටර් ලොරි රථ 01 ක් ජාතික ලොතරැයි මණ්ඩලය සතුව නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛණයේද ඇතුළත් වී නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

## ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **දළ පිරිවැටුම** | 03 | **37,983,206,760** | **32,014,201,280** |
| **අඩුකළා : වක්‍ර බදු** | | | |
| එකතුකළ අගය මත බදු (VAT) | | 1,658,592,022 | 1,164,695,700 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) | | 719,239,399 | 597,823,835 |
| **ශුද්ධ පිරිවැටුම** | | **35,605,375,339** | **30,251,681,745** |
| අඩුකළා: විකුණුම් පිරිවැය | 04 | 32,561,245,336 | 28,227,236,781 |
| **දළ ලාභය** | | **3,044,130,003** | **2,024,444,964** |
| එකතු කළා: වෙනත් ආදායම් | 05 | 939,253,314 | 1,322,749,168 |
| | | 3,983,383,317 | 3,347,194,132 |
| **අඩුකළා: වියදම්** | | | |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ වියදම් | 06 | 1,158,486,156 | 1,408,116,521 |
| ආයතනික හා පරිපාලන වියදම් | 07 | 1,128,174,614 | 1,056,920,215 |
| මූල්‍ය හා වෙනත් වියදම් | 08 | 3,454,692 | 37,304,827 |
| **බදු පෙර ලාභ** | | **1,693,267,855** | **844,852,568** |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 09 | 189,065,042 | 193,975,415 |
| **වර්ෂය සඳහා ලාභ** | | **1,504,202,812** | **650,877,152** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත අංගයකි.

## විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **වර්ෂය සඳහා ලාභ** | **1,504,202,812** | **650,877,152** |
| **පසුකාලීන කාලපරිච්ඡේදයේ දී ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොවිය යුතු විස්තීර්ණ ආදායම (ශුද්ධ බදු)** | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ / (අලාභ) | (7,876,533) | 7,572,085 |
| ආයුගණක ප්‍රතිලාභ / (අලාභ) මත විලම්භිත බදු ප්‍රතිවර්තනය / (වියදම) | 2,362,960 | (2,271,626) |
| ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය | - | 547,325,750 |
| ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය මත වූ විලම්භිත බදු | - | (164,197,725) |
| **බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **1,498,689,239** | **1,039,305,637** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 1,326,750,107 | 1,089,340,971 |
| ආයෝජන දේපළ | 11 | 46,739,417 | 49,224,917 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 684,792 | - |
| නොනිමි ප්‍රාග්ධන වැඩ - ප්‍රධාන ගොඩනැගිල්ල | 13 | - | - |
| විලම්භිත බදු වත්කම් | 14 | - | - |
| සේවක ණය | 15 | 99,382,279 | 100,972,808 |
| දිගු කාලීන ආයෝජන | 16 | - | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,473,556,595** | **1,239,538,695** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 17 | 44,907,912 | 58,018,187 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 18 | 135,795,532 | 248,775,730 |
| වෙනත් ජංගම වත්කම් | 19 | 252,566,174 | 175,861,437 |
| කෙටි කාලීන ආයෝජන | 20 | 462,977,820 | 425,408,312 |
| මුදල් හා මුදලට සමාන දෑ | 21 | 8,681,052,763 | 8,130,550,104 |
| **මුළු ජංගම වත්කම්** | | **9,577,300,200** | **9,038,613,769** |
| **මුළු වත්කම්** | | **11,050,856,795** | **10,278,152,465** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| රඳවාගත් ඉපැයීම් | 22 | 4,040,219,693 | 3,603,093,604 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක | 23 | 2,733,180,624 | 2,731,617,473 |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | **6,773,400,318** | **6,334,711,076** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳියාව | 24 | 97,383,455 | 81,161,686 |
| විලම්භිත බදු වගකීම | 14 | 159,570,577 | 154,179,246 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **256,954,032** | **235,340,932** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 25 | 3,737,565,067 | 3,602,003,773 |
| ගෙවිය යුතු වර්තමාන බදු | 26 | 282,937,376 | 106,096,683 |
| **මුළු ජංගම වගකීම්** | | **4,020,502,445** | **3,708,100,457** |
| **මුළු වගකීම්** | | **4,277,456,477** | **3,943,441,389** |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | **11,050,856,795** | **10,278,152,465** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS සහ SLFRS) හා 1963 අංක 11 දරණ මුදල් පනතේ අවශ්‍යතාවයට මුදල් (සංශෝධන) පනතේ 1997 අංක 35 සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධන) පනත සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ සංශෝධන වලට අනුකූල වේ.

**ගීතා පෙරේරා**
නි. සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් මූල්‍ය

**නන්දිකා රෝෂාණි ද සිල්වා**
ස. සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ .
අත්සන් කළේ මණ්ඩලය වෙනුවෙන්,

**එම්.ඩී.සී. ජේ. පෙරේරා**
සභාපති

**එම්.පී.ඩී.පී. පතිරණ**
අධ්‍යක්ෂ

කොළඹ
*24.02.2025*

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත අංගයකි.

## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සම්මුචිත භාණ්ඩාගාර අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | ගොඩනැගිලි සංචිත රු. | ත්‍යාග සංචිත රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | **21,263,101** | **298,261,466** | **1,264,594,304** | **2,240,661,848** | **2,396,866,788** | **6,221,647,509** |
| ත්‍යාග සංචිතය භාවිතය | - | - | - | (550,049,200) | 550,049,200 | - |
| ත්‍යාග සංචිතයේ පැරණි ශේෂ නිවැරදි කිරීම සහ මාරු කිරීම් | - | - | - | 73,757,929 | - | 73,757,929 |
| මහා භාණ්ඩාගාරයට ගෙවන ලද විශේෂ බදු | - | - | (1,000,000,000) | - | - | (1,000,000,000) |
| ප්‍රත්‍යාගණනය කරන ලද ඉඩම් සහ ගොඩනැඟිලි | - | 547,325,750 | - | - | - | 547,325,750 |
| ප්‍රත්‍යාගණනය කරන ලද ඉඩම් සහ ගොඩනැඟිලි මත විළම්භිත බදු | - | (164,197,725) | - | - | - | (164,197,725) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක අලාභ | - | - | - | - | 7,572,085 | 7,572,085 |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වල ආයුගණක අලාභවලට ආරෝපණය කළ හැකි විලම්භිත බදු | - | - | - | - | (2,271,626) | (2,271,626) |
| **වර්ෂය සඳහා ලාභ** | - | - | - | - | 650,877,152 | 650,877,152 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **21,263,101** | **681,389,491** | **264,594,304** | **1,764,370,578** | **3,603,093,600** | **6,334,711,075** |
| | | | | | | |
| ත්‍යාග සංචිත භාවිතය | - | - | - | 1,563,152 | (1,563,152) | - |
| දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ තක්සේරු ලාභය ලිහාහැරීම් | - | (316,118) | - | - | 316,118 | - |
| මහා භාණ්ඩාගාරයට ගෙවන ලද විශේෂ බදු | - | - | - | - | (1,060,000,000) | (1,060,000,000) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ප්‍රතිලාභ | - | - | - | - | (7,876,533) | (7,876,533) |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වල ආයුගණක ප්‍රතිලාභවලට ආරෝපණය කළ හැකි විලම්භිත බදු | - | - | - | - | 2,362,960 | 2,362,960 |
| **වර්ෂය සඳහා ලාභ** | - | - | - | - | 1,504,202,812 | 1,504,202,812 |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **21,263,101** | **681,073,373** | **264,594,304** | **1,765,933,730** | **4,040,535,807** | **6,773,400,314** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ මුදල් ගලායාම** | | |
| බදු පෙර ලාභ | 1,693,267,855 | 844,852,568 |
| | | |
| **ගැලපීම්** | | |
| ක්ෂය කිරීම් | 27,572,840 | 14,888,701 |
| ක්‍රමක්ෂය කිරීම | 2,560,708 | 1,473,622 |
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 17,156,070 | 19,498,310 |
| ආයෝජන දේපලවල ධාරණ වටිනාකම් වැඩි වීම | - | (26,884,983) |
| ගොඩනැගිලි නැවත ප්‍රත්‍යාගණනය කිරීමේ පාඩුව | - | 581,103 |
| හානිකරන ගැලපීම් - නොනිම් ප්‍රාග්ධන වැඩ | - | 27,178,359 |
| විනිමය ලාභ | 6,004 | (3,300,399) |
| බොල් ණය/(අධි වෙන්කිරීම්) | (901,639) | 4,697,428 |
| විවිධ ආදායම් - ලියා හරින ලද ශේෂයන් | (216,972,325) | (68,203,023) |
| පැරණි ශේෂයන් නිවැරදි කිරීම සහ ලියා හැරීම | 212,113 | 1,455,528 |
| ආදායම | (705,204) | (760,816) |
| පොලී ආදායම | (715,227,589) | (1,194,699,827) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | 806,485,565 | (379,223,430) |
| | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග (වැඩිවීම්) / අඩුවීම් | 13,110,275 | (9,747,636) |
| වෙළඳ ලැබිය යුතු (වැඩිවීම්) / අඩුවීම් | 113,881,837 | (31,557,892) |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්) / අඩුවීම් | (92,646,674) | (95,557,684) |
| එ. අ. බදු හා ස.ආ.දී. බදු ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 90,640,039 | 33,804,632 |
| ත්‍යාග ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | (223,212,509) | 717,793,318 |
| රජයට ගෙවිය යුතු දායකත්වය (විශේෂ බදු) ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 75,605,523 | 94,790,095 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්) | 500,140,605 | 158,549,045 |
| | 1,284,004,662 | 488,850,449 |
| | | |
| ගෙවන ලද ආදායම් බදු | (79,380,272) | (206,821,185) |
| අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවන ලද පිරිවැය | (8,810,834) | (7,004,270) |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ ශුද්ධ මුදල් ගලායාම** | **1,195,813,556** | **275,024,994** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ මුදල් ගලායාම** | | |
| දේ.පි.උ. වෙත එකතු කිරීම්, ආයෝජන දේපල, අස්පෘශ්‍ය වත්කම් සහ නොනිම් වැඩ | (266,229,089) | (6,157,118) |
| දේ.පි.උ. බැහැර කිරීමෙන් ලැබෙන ආදායම | 970,381 | - |
| දිගු කාලීන ආයෝජන | - | 500,000,000 |
| කෙටි කාලීන ආයෝජන | (50,747,156) | 2,270,454,190 |
| සංචාරක බංගලාවලින් ලැබෙන ආදායම සහ මණ්ඩලීය වාහන වලින් ලැබෙන කුලී | 705,204 | 764,520 |
| සේවක ණය ප්‍රදාන | (65,007,784) | (43,980,017) |
| සේවක ණය ආපසු අය කර ගැනීම් | 66,598,313 | 45,032,870 |
| ලැබුණු පොලී ආදායම් | 728,405,237 | 1,599,775,459 |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **414,695,106** | **4,365,889,903** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ මුදල් ගලායාම** | | |
| ගොඩනැගිලි සංචිත අරමුදල මගින් විශේෂ බදු ලෙස මහා භාණ්ඩාගාරයට මාරු කිරීම | - | (1,000,000,000) |
| රඳවාගත් ඉපැයුම් මගින් විශේෂ බදු ලෙස මහා භාණ්ඩාගාරයට මාරු කිරීම | (1,060,000,000) | - |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **(1,060,000,000)** | **(1,000,000,000)** |
| | | |
| වර්ෂය තුළ මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්) | 550,508,661 | 3,640,914,897 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ (සටහන්) | 8,130,544,100 | 4,489,635,206 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | **8,681,052,763** | **8,130,550,104** |
| | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්** | | |
| **මුදල් හා මුදලට සමාන දෑ** | | |
| කෙටිකාලීන ආයෝජන | 8,386,932,808 | 7,751,325,604 |
| අතැති හා බැංකු තුල ඇති මුදල් | 294,119,955 | 379,224,500 |
| **වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ** | **8,681,052,763** | **8,130,550,104** |
| | | |
| **සටහන් : වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ** | 8,130,550,104 | 4,486,334,807 |
| එකතු කළා: විනිමය ලාභ/අලාභ | (6,004) | 3,300,399 |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ** | ***8,130,544,100*** | ***4,489,635,206*** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන් අංක 01

## 1.සංස්ථාමය තොරතුරු

### 1.1. වාර්තා කරන ආයතනය

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි ("මණ්ඩලය") පිහිටුවනලදි. ඉහත පනතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

මෙය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයකි.

ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන පිහිටා ඇත්තේ කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්. ජේ. මුදලිගේ මාවත, අංක 32 දරණ ස්ථානයේ ය.

### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අභිලාශය රජයට ආදායම් උත්පාදනය සඳහා ජාතික ලොතරැයි පැවැත්වීමයි.

### 1.3. මූල්‍ය කාලපරිච්ඡේදය

මණ්ඩලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාලයයි.

### 1.4. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) අනුගමනය කරමින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ

මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සංරචක අඩංගු වේ.

- විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වර්ෂය අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරයි.
- ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය සමාලෝචිත වර්ෂයෙහි මණ්ඩලයේ මුදල්වල වෙනස්වීම විස්තර කරයි.
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා මුදලට සමාන දෑ උත්පාදනය සඳහා මණ්ඩලයට ඇති හැකියාව හා මෙම මුදල් උපයෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු සපයයි.
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනිකුත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

සටහන් අංක 02

## 2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

#### 2.1.1. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS)අනුගමනය කරමින් ඓතිහාසික පිරිවැය පදනම හා සත්‍ය වටිනාකම් පදනම යටතේ උපචිත පදනමට ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 25 දින අධිකාරී බලය පවරන ලදි.

#### 2.1.2. අනුකූලතා ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිලියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS & SLFRS) සහ 1963 අංක 11 සහ 1997 අංක 35 සහ 1998 අංක 22 දරණ (සංශෝධිත) මුදල් පනතට සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවය.

#### 2.1.3. අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් කර ඇති අතර අස්වීත්වය ඇවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට ඔවුන් අපේක්ෂා නොකරයි. පූර්වේක්ෂිත අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාමට සම්පත් තමන් සතු බවට කළමනාකාරිත්වය සෑහීමකට පත් වෙයි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව මත සැලකිය යුතු සැකයන් පහළ කරන්නා වූ කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ කළමනාකාරිත්වය නොදනී. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනමක් මත මූල්‍ය ප්‍රකාශ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

#### 2.1.4. සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදාගෙන ඇති අතර ඒවා පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තැන්හිදී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ නැවත සකස් කර හා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 -'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' අනුගමනය කරමින් පෙර වසරේ ගිණුම්කරණ ප්‍රමිති සමග මණ්ඩලය විසින් මෙම ප්‍රමිති සංගතව ආදේශ කොට ඇත.

#### 2.1.5. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

සියලු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට (එතැන් විනිමය අනුපාතය) වාර්තාකරණ ව්‍යවහාර මුදල් ඒකකය මත ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ සහ මූල්‍ය අයිතම වසර අවසාන විනිමය අනුපාතයන්ට ප්‍රති මැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන්, ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් හෝ බැරකම්, වසර අවසාන එතැන් විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන අගයට පරිවර්තනය කරනු ලබන අතර, එයින් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලැබේ.

### 2.1.6. මැනීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිලිබඳ වාර්තාවේ පහත දැක්වෙන ද්‍රව්‍යමය අයිතම හැරුණු විට, මූල්‍ය ප්‍රකාශ පිලියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේය.

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා බැරකම්, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ සහ හඳුනා නොගත් ආයු ගණන වැනි එකතුව, අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩු කොට වත්මන් වටිනාකමට හඳුනාගනු ලැබේ.
- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට බලපාන්නාවූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

මුදල් ප්‍රවාහයන් පිළිබඳ තොරතුරු හැර මුල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම අනුව සකස් කර ඇත.

### 2.1.7. ව්‍යවහාර සහ වාර්තාකරණ මුදල් ඒකක

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මණ්ඩලය භාවිත කරන ව්‍යවහාර මුදල්වන රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇති විටෙක හැර, රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නම රුපියලට වටයා ඇත.

### 2.1.8. ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන්ගේ එක් එක් ද්‍රව්‍යමය පංතිය මූල්‍ය ප්‍රකාශනයන්හි සමුච්චිතව ඉදිරිපත් කර තිබේ. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම. පිළිබඳව වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර.1 මගින් අවසර දී ඇති පරිදි වැදගත් නොවන්නේ නම් පමණක් ස්වභාවයෙන් හෝ කර්තව්‍යයෙන් වෙනස් අයිතම වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇති විට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මුල්‍ය වගකීම් හිලව් කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය ප්‍රකාශ තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කිරීම සිදු කරයි. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත අනාවරණයකදී හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

### 2.1.9. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

**(අ) විනිශ්චයන්**
ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑම සහිත, ඇස්තමේන්තු පිළිබඳ විනිශ්චයන් හැරුණු විට, කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර තිබේ.

**(ආ) ඇස්තමේන්තු හා උපකල්පන**
මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත අනාගතයට අදාල වැදගත් උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර සැලකිල්ලට ලක් කර තිබේ.

## 2.2. වත්කම්

### වත්කම් සහ ඒවායේ තක්සේරුකිරීම් පදනම්

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සියලු කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

### 2.2.1. දේපල, පිරියත සහ උපකරණ

**හඳුනාගැනීමේ පදනම**

අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුලින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විටකදී, දේපල, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනාගනු ලැබේ.

සියලුම දේපල, පිරියත සහ උපකරණ මූලික පිරිවැයට වාර්තා කර ඇත. දේපල, පිරියත සහ උපකරණ,එවැනි වත්කම්වල සම්පූර්ණ පන්තියම නැවත ඇගයිමට ලක්කරන අවස්ථාවේදි නැවත ඇගයිමට ලක් කෙරේ.

**මැනීමේ පදනම**

**(අ) පිරිවැය**

සියලු දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයටය. වත්කම් අත් කර ගැනීම සඳහා ඍජුව ආරෝපණීය වියදම් පිරිවැයට ඇතුලත් වේ. මණ්ඩලය විසින් ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ ඍජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීන ඉදිකිරීම් සඳහා ප්‍රාග්ධනත කළ ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. අනෙකුත් සියළු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය  දරනු ලබන අවස්ථාවේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිලිගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසුව එය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනයක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් අදාළ වත්කමේ පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී, ප්‍රතිස්ථාපනය කළ කොටස මණ්ඩලය ඉවත් කර නව කොටස හා ඒ හා ආශ්‍රිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හඳුනාගනු ලැබේ, අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැය ඇතුලත් කරනු ලැබේ.

**(ආ) ප්‍රත්‍යාගණනය**

වත්කම් මනිනු ලබන්නේ වත්කම මත සමුච්චිත ක්ෂයවීම සහ ප්‍රත්‍යාගණන දිනයෙන් පසු හඳුනාගනු ලබන හානි අලාභ අඩු කොට සාධාරණ වටිනාකමටය. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ගණනය කිරීම් සැලකිය යුතු වාර ගණනකින් සිදු කරනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක්, අනෙකුත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනා ගනු ලැබූ එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුවීමක් එය ප්‍රතිවර්තකරණ ප්‍රමාණයට හැර අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලබන අතර, එවන් අවස්ථාවකදී වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණන හිගයක්, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කම් මතම පවත්නා අතිරික්තයන් එය හිලව් කරන ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

වත්කමක ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම මත පදනම් ක්ෂයවීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම් ක්ෂයවීම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට වාර්ෂික පැවරුමක් සිදු කරනු ලැබේ. ඊට අතිරේකව, ප්‍රත්‍යාගණන දිනයට සමුච්චිත ක්ෂයවීම වත්කමක දළ ධාරණ වටිනාකමේ ප්‍රමාණයට ඉවත් කරන අතර ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීමේදී, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාල කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

සියලු දේපල, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තාකරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ දෙවනුව ප්‍රත්‍යාගණනය කිරීමේදී, කළ හැකි සෑම විටකදීම එවැනි වත්කම්වල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ඉඩම් හා ගොඩනැගිලි, වාහන, පරිගණක හා උපාංග, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් පසුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ රජයේ තක්සේරුකරු හෝ අංක 2018/04 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තරව පත්කරන ලද කමිටුවක් මගින් කාලීනව සිදුකරන තක්සේරු පාදකව සාධාරණ වටිනාකමට දරනු ලැබේ. ආසන්නතම තක්සේරුව සම්පූර්ණ කරන ලද්දේ 2023 වසරේදිය.

**(ඇ) ක්ෂයවීම**

ක්ෂයවීම පදනම්ව ඇත්තේ වත්කමක පිරිවැයෙන් එහි සුන් බුන් අගය අඩු කිරීමෙනි. එක් එක් වත්කම්වල සැලකිය යුතු සංරචක තක්සේරු කරනු ලබන අතර යම් සංරචකයකට එම වත්කමේ ඉතිරි ඒවායින් වෙනස් ඵලදායි ජීව කාලයක් තිබේ නම්, එම සංරචකය වෙනම ක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එසේ කරනුයේ එම වටිනාකම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය පුරා ලියා හැරීමටය.

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිටවන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය. වත්කම්වල සුන් බුන් වටිනාකම්, ඵලදායි ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය නම් පමණක් වෙනස් කරනු ලැබේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ ක්ෂයවීම් ප්‍රතිපත්තියට අනුව වත්කමක් මිලදී ගත් මාසයේ දී ක්ෂය වන අතර බැහැර කළ හෝ ඵලදායී ජීවකාලය අවසන්වන මාසයේ ක්ෂයවීම් ගණනය නොකෙරේ.

පෙර වසරවල සංගත පැවති මෙම කාර්යය සඳහා යොදා ගනු ලැබූ මූලික වාර්ෂික ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

| | වාර්ෂිකව % |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 05 |
| දිනුම්ඇදීම සඳහා ගන්නා යන්ත්‍ර, ලොතරැයි උපකරණ | 20 |
| මෝටර් රථ | 25 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ | 20 |
| ප්‍රවර්ධන උපකරණ | 33.33 |

**(ඈ) පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය තුලට ලැබීමේ භව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණි පහත දී ඇති ඉවත්

කිරීමේ ප්‍රතිපත්තිය යටතේ, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටස්වල ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරිමේ පිරිවැය ඒවා දරනු ලබන විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගලපනු ලැබේ.

**(ඉ) නැවත හඳුනාගැනීම**

මුලින් හඳුනාගත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් සහ ඒවායේ යම් වැදගත් කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදී ඉවත් කරනු ලැබේ. විකිණීමේදී හෝ වත්කම ඉවත් කිරීම මත මතුවන කිසියම් ප්‍රතිලාභයක් හෝ අලාභයන් (බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ වත්කම් ධාරණ වටිනාකම අතර වෙනස) වත්කම ඉවත් කරනු ලැබූ විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගලපනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල සුන් බුන් වටිනාකම්, ඵලදායී ජීවකාලය, ක්ෂය කිරීමේ ක්‍රම වේද සමාලෝචනය කරනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශවල සපයා ඇති තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම පිණිස හේතුවන යෝග්‍ය ප්‍රතිපත්ති ඉදිරිකාලීනව ගලපනු ලැබේ.

**(ඊ) පුනස්ථාපන පිරිවැය**

ආරම්භයේදී තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ නඩත්තු කිරීම පිණිස දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා හෝ නඩත්තුව සඳහා දරන ලද වියදම්, දරනු ලැබූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.2. නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ, වත්කම පළමු උපයෝජන අවස්ථාවේදී අදාල වත්කම් ගිණුමට පවරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන පිරිවැය යනු මිලදීගැනිමේ හෝ ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත වෙනත් ඕනෑම වියදමක් සහිත පිරිවැය වේ.

ස්ථිර ස්වභාවයේ නොනිමි ප්‍රාග්ධන වැඩ මත හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය ඉහළ නැංවීම පිණිස දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් සේ සලකා තිබේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපයෝජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

### 2.2.3. අස්පෘශ්‍ය වත්කම්

**පරිගණක මෘදුකාංග**

වෙන් වෙන්ව අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩු කර පිරිවැයට ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යනු කුලිය සඳහා හෝ පරිපාලන කාර්යය සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා දරනු ලැබූ භෞතික ද්‍රව්‍යය නොමැති හඳුනාගත හැකි මූල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ආයු කාලය පරිමිත හෝ අපරිමිත සේ තක්සේරු කරනු ලැබේ. පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂයකරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී ඇත්තේ යැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසිමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත් පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව 25% අනුපාතයට ක්‍රම ක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේ හෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම් උචිත පරිදි, ක්‍රමක්ෂ කාලසිමාව හෝ ක්‍රම වේදය වෙනස් කිරීම මගින් ගිණුම් ගත කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සලකනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - 'අස්පෘශ්‍ය වත්කම්' ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිලිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබේ.

### 2.2.4. කල්බදු වත්කම්

**කල්බදු**

කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ ආරම්භයේදී සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දේට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාලසීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය, කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ වැඩි දියුණු කිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ යන දෙකින් වඩා කෙටිකාලයක පුරා ප්‍රාග්ධනගත කිරීම සහ ක්ෂය කිරීම කරනු ලැබේ.

වත්කම් විකිණීමට සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාලව පවතින වටිනාකමට සාපේක්ෂව විකුණුම් වටිනාකමේ අතිරික්තයක් වේ නම් එම ප්‍රමාණය විලම්භිත කර බදු කාලසීමාව තුලදී ක්‍රමක්ෂයකරනු ලැබේ.

**කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් වත්කම් බදු දීම**

වටිනකමින් අඩු වත්කම හා කෙටිකාලින කල්බදු සඳහා භාවිතා කරන වත්කම් වල කල්බදු හා කල්බදු වගකීම් වල අයිතිය හඳුනා නොගැනීමට මණ්ඩලය තීරණය කර ඇත. මෙම කල්බදු හා සම්බන්ධ වන කල්බදු ගෙවීම් කල්බදු කාල සීමාව පුරාවට සරල මාර්ග ක්‍රමය යටතේ වියදමක් ලෙස වාර්තා කරනු ලැබේ.

### 2.2.5. ආයෝජන දේපල

මණ්ඩලයේ කල්බදු වත්කම්වල අනුරාධපුර සහ මන්නාරම සංචාරක බංගලා අයත්වේ

**(අ) හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා එනමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලදී විකිණීම, භාණ්ඩ හෝ සේවා නිපදවීමේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා හෝ පරිපාලනමය කාර්යය සඳහා නොවන දේපල වේ.

**(ආ) මැනීමේ පදනම**

අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සහ ආයෝජන දේපලේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ භව්‍යතාවක් තිබේ නම් පමණක්ම ආයෝජන දේපල හඳුනාගනු ලැබේ. නිදහස් අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලිවලින් සමන්විත, ආයෝජන දේපල යනු දිගුකාලීන කුලී සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකම සඳහා රඳවාගනු ලබන දේපල වන අතර භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා හෝ පරිපාලනය සඳහා යොදාගනු නොලබන අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට අදහස් කරනු නොලබයි.

ආයෝජන දේපල ආරම්භයේදී සහ පසුකාලීනව ආශ්‍රිත ගනුදෙනු පිරිවැය ඇතුළුව, පිරිවැයට මනිනු ලබන අතර එබැවින් සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකොට පවත්වා ගෙනයනු ලැබේ. වෙළඳපොල වටිනාකම විවෘත කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන දේපල වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකමේ වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**(ඈ) නැවත හඳුනාගැනීම**

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන නිසාවෙන් බැහැර කළ විටදී හෝ භාවිතයෙන් ස්ථිරවම අයින් කළ විටදී ආයෝජන දේපල ඉවත් කරනු ලැබේ.

**(ඇ) ආයෝජන දේපලවලට / දේපලවලින් පසුකාලීන පැවරුම්**

අයිතිකරුගේ අධිවාසය අවසන්වීම, වෙනත් පාර්ශ්වයකට මෙහෙයුම් බදු දීමක් ආරම්භ කිරීම හෝ විකිණීමේ අරමුණ ඇතිව ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කිරීම මගින් තහවුරු වන, භාවිතයේ වෙනසක් සිදුවූ විට පමණක්ම ආයෝජන දේපලවලට පැවරුම් සිදු කරනු ලැබේ.

### 2.2.6. මූල්‍ය නොවන වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ දිනයකටම වත්කමක් හානි වී ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයි. එවැනි හානිකරණ ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට මූල්‍ය නොවන වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විකිණීමේදී දරන පිරිවැය අඩු කළ වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගය සහ භාවිතා කිරීමේ වටිනාකමට වඩා වත්කමක ආපසු අය කර ගත හැකි අගය ඉහළ වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් ජනන ඒකකය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්මනෙහි විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ මිලැයුම් ගුණාකාර, ප්‍රකාශිත කොටස් මිල, හෝ පවතින අනෙකුත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය ස්කන්ධ කරා රැගෙන යනු ලැබූ පූර්වයෙන් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම් හැරුණු විට, හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩ වල අඛණ්ඩ මෙහෙයුම්වල හානි අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එවන් අවස්ථාවකදී, පූර්වයෙන් සිදුකරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක වටිනාකම දක්වා හානිය ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර, වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් හානිකරණ අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. එවැනි නිරීක්ෂණයක් ඇත්නම්, මණ්ඩලය විසින් වත්කමේ ආපසු අය කරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනුයේ, අවසන් වරට හානිකරණ අලාභ හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වෙනස් වේ නම් පමණි. එය එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කරගත හැකි වටිනාකමට ඉහළ නංවනු ලැබේ.

පෙර වසරවලදී වත්කම සඳහා හානි අලාභයක් හඳුනාගෙන නොමැති නම්, එම වැඩිකල වටිනාකමට ක්ෂයවීම නොමැතිව නිශ්චය කිරීමට ඉඩ තිබූ ධාරණ වටිනාකම ඉක්මවා යාමට නොහැක. වත්කම ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වා නොගන්නේ නම් මිස, එබඳු ප්‍රතිවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර එබඳු අවස්ථාවකදී ප්‍රතිවර්තනය, ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

### 2.2.7. විකිණීම සඳහා රඳවා ගත් ජංගම නොවන වත්කම්

විකිණීම සඳහා ඇති වත්කම්වල ධාරණ වටිනාකම මූලිකවම විකුණුම් ගනුදෙනුවක් හරහා අය කර ගැනීමට නියමිත විටදී හා විකුණුම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවක් ඇතැයි සලකනු ලබන විටදී ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සඳහා පිරිවැය අඩුකොට ධාරණ වටිනාකම සහ සාධාරණ අගය යන දෙකින් වඩා අඩු අගයට සඳහන් කරනු ලැබේ.

ජංගම නොවන වත්කම් සහ බැහැර කරන කාණ්ඩ විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ විකිණීම සිදුවීම සඳහා ඉහළ හවයතාවයක් ඇති විටදී සහ වත්කම හෝ බැහැර කරන කාණ්ඩය එහි වත්මන් තත්ත්වයෙන් වහාම විකිණීම සඳහා පවතින විටදී පමණි දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීමෙන් පසුව ක්ෂය කිරීම හෝ ක්‍රමක්ෂය කිරීම කරනු නොලැබේ.

### 2.2.8. මූල්‍ය වත්කම්

**SLFRS 9 - මූල්‍ය උපකරණ: වර්ගීකරණය සහ මිණුම්**

2014 දී නිකුත් කරන ලද SLFRS 9, LKAS 39 මූල්‍ය උපකරණ: වර්ගීකරණය සහ මිනුම් මගපෙන්වීම ප්‍රතිස්ථාපනය කරයි. මූල්‍ය වත්කම් වල හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු ආකෘතියක් සහ නව සාමාන්‍ය හෙජ් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළුව මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මැනීම පිළිබඳ සංශෝධිත මගපෙන්වීමක් SLFRS 9 ට ඇතුළත්වේ. LKAS 39 වෙතින් මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ හඳුනාගැනීම පිළිබඳ මගපෙන්වීම ද එය ඉදිරියට ගෙනයයි.

වත්කම අත්පත් කරගත් කාර්යය මත පරායත්ත වූ මණ්ඩලය සිය මූල්‍ය වත්කම් පහත සාකච්ඡා කර ඇති කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ. එක් එක් කාණ්ඩ සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපත්ති පහත පරිදි වේ.

**(අ) වෙළඳ ලැබීම්**

සක්‍රිය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සැපයීම හරහා ඒවා මූලිකවම මතුවන නමුත් (උදා : වෙළඳ ලැබිය යුතු දෑ) අනෙකුත් ආකාරයේ ගිවිසුම්ගත මූල්‍ය වත්කම් ද එයට අන්තර්ගත වේ. සාධාරණ වටිනාකමට සහ ඒවා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට ඒවා පළමුව හඳුනාගනු ලැබේ.

**(ආ) වෙනත් ජංගම වත්කම්**

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මූලිකවම මනිනු ලබන්නේ පිරිවැයටය.

**ඇ) බොල් ණය සඳහා ප්‍රතිපාදන**

බැංකු ඇපකරවල වටිනාකම අඩුකර එක් එක් වෙළඳ ණය ප්‍රමාණය මත පහත සඳහන් ආයු කාල විශ්ලේෂණ අනුපාත මත අනාරක්ෂිත වෙළඳ ණයගැතියන් මත වූ බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

| ණය කාල සීමාව | ප්‍රතිශතය (%) |
|---|---|
| **සක්‍රිය ණය ගැතියන්** | |
| මාස 0-3 දක්වා | - ප්‍රතිපාදන නැත |
| මාස 4-6 දක්වා | - 2.5% |
| මාස 7-12 දක්වා | - 5% |
| මාස 12ට වැඩි | - 10% |
| **අක්‍රිය ණය ගැතියන්** | |
| නීතිමය නඩු සහ වෙනත් ආරවුල් යටතේ ණය ගැතියන් | - 100% |

### 2.2.9. තොග

නිෂ්පාදනයේ කෙටි ජීවන චක්‍රය හේතු කොටගෙන ශුද්ධ උපලබ්ධි අගයක් නොමැතිවීම නිසා යල්පිනු සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, තොගය පිරිවැයට පමණක් මනිනු ලැබේ ලොතරැයිපත් වේගයෙන් අලෙවි වන බැවින් ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමේ අවශ්‍යතාවයක්

නොමැත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට තොගය විකිණිය හැකි මිලය.

රන් භාණ්ඩ, මෝටර් රථ සහ අනෙකුත් ත්‍යාග ඇතුළත් ත්‍යාග භාණ්ඩ තොග, ඒවාට විකුණුම් වටිනාකමක් නොමැති බැවින් සහ දරන ලද වියදම පමණක් ඇති බැවින් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. එවැනි සියලු තොග අනාගතයේ ඕනෑම වේලාවක ත්‍යාග ලෙස පිරිනමනු ලබන මුත් සාමාන්‍ය වෙළඳ ගනුදෙනුවක් මගින් විකුණනු නොලැබේ.

වෙළෙඳ තොගය ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය තොග පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

**2.2.10. මුදල් හා මුදලට සමාන දෑ**

අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු මුදල් හා මුදලට සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ. අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඊට ඇතුලත් වේ,

වක්‍ර ක්‍රමය මත පාදකව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

**2.2.1. LFRS 13 සාධාරණ අගය මත මැනීම**

ශ්‍රී.ලං.ගි.ප්‍ර. (SLFRS 13) සාධාරණ අගය මත මැනීම් ශ්‍රී.ලං.ගි.ප්‍ර. අනුව පුනරාවර්තන හා පුනරාවර්තන නොවන පදනම හා යොදාගන්නා ලද තක්සේරු ක්‍රමවේද මත වත්කම් හා වගකීම්වල සාධාරණ අගය ගණනය කර ඇත.

## 2.3 ස්කන්ධ ප්‍රාග්ධනය, වගකීම් හා ප්‍රතිපාදන

**2.3.1. ස්කන්ධ ප්‍රාග්ධනය**

**සම්මුච්ත භාණ්ඩාගාර අරමුදල**
මෙය මහා භාණ්ඩාගාරය විසින් යෙදවූ ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරයි.

**ප්‍රත්‍යාගණනය කළ සංචිතය**
රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් හෝ 2018/04 දරණ චක්‍රලේඛය ප්‍රකාරව පත් කරන ලද අභ්‍යන්තර කමිටුවක් විසින් සිදු කරන ලද දේපල, යන්ත්‍ර හා උපකරණ නැවත ප්‍රත්‍යාගණනයේ ශුද්ධ ප්‍රත්‍යාගණිත ලාභය ප්‍රත්‍යාගණන සංචිත තුළින් නියෝජනය කරයි.

**ගොඩනැගිලි සංචිත අරමුදල**
යෝජිත ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමේ හා ප්‍රයෝජනයට ගැනීම සඳහා ගොඩනැගිලි සංචිත අරමුදල පිහිටුවා ඇත.

**ත්‍යාග සංචිත අරමුදල**
ලොතරැයිවල සුපිරි ත්‍යාග සහ විශේෂ දිනුම්වාරවල ත්‍යාග පිරිනැමීම සඳහා මණ්ඩලය විසින් ත්‍යාග සංචිත අරමුදල පවත්වාගෙන යනු ලබයි.

**රඳවාගත් ඉපැයීම්**
මෙයින් මෙහෙයුම්වල බදු පසු සමුච්චිත ශුද්ධ අතිරික්තය නියෝජනය කරයි.

**2.3.2. බැරකම්**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන බැරකම් වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී හඳුනාගත් සියලුම බැරකම් ගිණුම්ගත කොට ඇත.

වෙළඳ ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පොත් වටිනාකමට සඳහන් කර ඇත.

### 2.3.3. ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) මණ්ඩලය සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

### 2.3.4. ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම් වර්තමාන බදු සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. ප්‍රාග්ධනයෙන් සෘජුවම පිළිගත් අයිතමවලට අදාළ නම්, එය කොටස් වශයෙන් පිළිගනු ලබන ප්‍රමාණයට හැර ආදායම් බදු වියදම ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ සෘජුවම හඳුනා ගැනේ.

**ආදායම් බදු**

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කර ඇත. ඒකාබද්ධ අරමුදලට කරන ලද දායක මුදල් මත ගෙවිය යුතු / ගෙවන ලද ආදායම් බදු අදාළ බලධාරීන් සමඟ එකඟවූ පරිදි අනාගත ප්‍රේෂණයන්ගෙන් අදාළ අරමුදලට වාරික වශයෙන් අයකර ගනු ලැබේ.

**විලම්බිත බදු**

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගනු ලැබේ. සියලු අඩුකළ හැම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන ගිය ප්‍රයෝජනයට නොගත් බදු බැර සහ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ සඳහා බදු අයකළ හැකි ලාභය පැවතීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම එක් එක් ශේෂපත්‍ර දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්බිත බදු සියල්ල හෝ ඉන් කොටසක් ප්‍රයෝජනයට ගනු ලැබීමට ඉඩදීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් පැවතීමට තවදුරටත් භව්‍යතාවයක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයේ එක් එක් දිනට නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට හැකි වන ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් මනිනු ලබන්නේ පනවනු ලැබ ඇති හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් දිනට සාරානුකූලව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි කළ හෝ බැරකම පියවනු ලැබූ අවස්ථාවේ එම වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ටය.

ආදයම් බදු වියදම කාරක ප්‍රාග්ධනයට සෘජුවම සම්බන්ධ අයිතමවලට හැර ලාභ අලාභ ප්‍රකාශයේ සෘජුවම වියදමක් ලෙස හඳුනා ගැනේ.

## 2.4. සේවක ප්‍රතිලාභ

### 2.4.1. කෙටි කාලීන - සේවක ප්‍රතිලාභ

වැටුප්, දිරි දීමනා, ප්‍රවාහන දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා, වෛද්‍ය පහසුකම්, නිල ඇඳුම් දීමනාව, ලොතරැයි දිනුම් ඇදීමේ දීමනා, අවදානම් දීමනා, අතිකාල දීමනා හා ආහාර සැපයීම්.

### 2.4.2. දිගු කාලීන - සේවක ප්‍රතිලාභ- ආපදා ණය, නිවාස ණය

### 2.4.3. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ. සේ.අ.අ. සඳහා සේවකයන්ගේ දායකත්වය 10% වන අතර මණ්ඩලය විසින් වැටුපෙන් 15% සපයයි. සේ.භා.අ. සඳහා මණ්ඩලය විසින් 3% සපයයි.

**(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම ඉටුකිරීම සඳහා ප්‍රතිපාදනයන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රක්ෂේපිතඒකකණය (PUC) ක්‍රමය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් විසින් නිර්දේශ කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව මෙම ප්‍රතිපාදනය සිදුකර ඇති අතර එම කාලසීමාව සඳහා වාරිකය ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වාර්තා කෙරේ. ආයුගණ කතක්සේරුව වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකු විසින් සිදුකරනු ලබන අතර සෑමවසරකම ආයුගණක තක්සේරුව සිදුකිරීමට මණ්ඩලය අපේක්ෂාකරයි.

අරමුදලට බාහිරව අරමුදල් සපයන්නේ නැත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, වගකීම ආරම්භ වන්නේ අඛණ්ඩ සේවා කාලය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

## 2.5. ආදායම් ප්‍රකාශනය

### 2.5.1. ආදායම හඳුනාගැනීම

ජාතික ලොතරැයි මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු සඳහා පාරිභෝගිකයින් සමග ගිවිසුම් ගත වීමක් අවශ්‍යනොවන අතර එය සාමාන්‍ය විකිණීමකි.

**(අ) SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් වලින් ලැබෙන ආදායම**

SLFRS 15 ආදායම හඳුනාගෙන තිබේ ද, කොපමණද, කවදා ද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. LKAS 18 ආදායම, LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ IFRIC 13 පාරිභෝගික පක්ෂපාතිත්ව වැඩසටහන් ඇතුළුව පවත්නා ආදායම් හඳුනාගැනී මේ මාර්ගෝපදේශය එය ප්‍රතිස්ථාපනය කරයි. දිනුම් ඇදීමේ ලොතරැයිවල ආදායම දිනුම් ඇදීමේ දිනයටද, ක්ෂණික ලොතරැයිවල ආදායම බිල්පත් දිනටද තහවුරු කරයි.

**(ආ) පොළිය**

කාල පදනමක් මත උපචිත වන සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත්**

අනෙකුත් ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

### 2.5.2. වියදම හඳුනාගැනීම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම්වල ඉපැයුම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදුවූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට ගලපනු ලැබේ.

### 2.5.3. රජයේ දායක මුදල් සඳහා ගෙවීම් (විශේෂ බදු)

1971 අංක 38 දරණ මුදල් පනතේ (9) (2) (ඊ) පරිච්ඡේදය අනුව රජයේ දායක මුදල් සඳහා (විශේෂ බදු) කරන ගෙවීම් හෝ රජයට කරන ගෙවීම් මුදල් අමාත්‍යවරයා විසින් වරින් වර තීරණය කරනු ලබන ප්‍රමාණය අනුව මණ්ඩලයේ ශුද්ධ ආදායම ගණනය කිරීමේදී ආදායමට එරෙහිව ගලපන ලදි.

## 2.6. සාමාන්‍ය කරුණු

### 2.6.1. වාර්තා කරන දිනට පසු සිදු වූ සිදු වීම්

වාර්තා කරන දිනට සිදු වූ පැන නැගුණු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම හෝ හෙළිදරව් කිරීම කර මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල දක්වා ඇත.

### 2.6.2. සංසන්දනාත්මක දත්ත

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය තැන්වලදී සංසන්දනාත්මකව නැවත වර්ගීකරණය කර දක්වා ඇත.

### 2.6.3. ණය සහ ලැබිය යුතුදේ

නිවාස ණය - අවුරුදු 07ක මූලික වැටුප (උපරිමය රු.3,000,000/= දක්වා) පොළී අනුපාතය 4% වයස අවුරුදු 55 දක්වා අය කර ගැනීම. 2023 වසරට පෙර පොළී අනුපාතය 4% වු අතර එය රු.50,000/- දක්වා 3% ලෙසද රු.50,000/- සිට රු.1,000,000/- දක්වා 6% ලෙසද ඉතිරි ශේෂය සඳහා 7% ලෙසද සංශෝධනය කරන ලදී.

මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන නිවාස ණය සඳහා SLFRS 9 මූල්‍ය උපකරණ යටතේ සාධාරණ වටිනාකම් සංකල්පය අනුගමනය කර ඇත.

ආපදා ණය - මාස 10 මූලික වැටුප (උපරිමය රු.250,000/= දක්වා) පොළී අනුපාතය 4.2% මාසික වාරික 60 කින් අය කර ගැනීම.

### 2.6.4. බැදීම් සහ අසම්භව්‍ය වගකීම්

අසම්භව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වත්මන් වගකීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැදීම් වේ. මණ්ඩලයේ ප්‍රාග්ධන වගකිම් සහ අසම්භව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

### 2.6.5. හිමිකම් නොපෑ ත්‍යාග

අදාළ දිනුම් ඇදීමේ දින සිට මාස හයකට පසු හිමිකම් නොපෑ ත්‍යාග රාජසන්තක වන අතර එය කාර්තුමය පදනමින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

### 2.6.6. අරමුදල් බෙදාහැරීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ මණ්ඩලය විසින් 2008 සැප්තැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි ටිකට්පතක මිල රු.10.00 සිට රු.20.00 දක්වාද 2023 ජූලි 06 සිට බලපැවැත්වෙන පරිදි රු.20/- සිට රු.40/- දක්වාද වැඩිකරන ලදී. ඒ අනුව නියෝජිත කොමිස්ද 15% සිට 17.5% දක්වා 2008 දි වැඩි විය. තවද 2019 ජූලි 01 මාසයේ සිට නියෝජිත කොමිස් ද 17.5% සිට 18.75% දක්වා වැඩිවිය.

අ) දිනුම් අදින ලොතරැයිවලට අදාළ අරමුදල් බෙදාහැරීම පහත පරිදි වේ.

| | මහජන සම්පත | ගොවිසෙත | ධන නිධානය | මෙගා පවර් | හඳහන | ලකී 7 | අද සම්පත |
|---|---|---|---|---|---|---|---|
| ත්‍යාග | 50.00% | 49.00% | 49.00% | 50.00% | 53.00% | 57.00% | 58.00% |
| නියෝජිත කොමිස් | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% | 18.75% |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිත කොමිස් | 1.25% | 1.25% | 1.25% | 1.25% | 1.25% | 1.25% | 1.25% |
| රජයට දායකත්වය | 16.50% | 10.00% | 10.00% | 10.00% | 10.00% | 10.00% | 10.00% |
| මණ්ඩලීය වියදම් | 13.50% | 21.00% | 21.00% | 20.00% | 17.00% | 13.00% | 12.00% |
| **එකතුව** | **100%** | **100%** | **100%** | **100%** | **100%** | **100%** | **100%** |

ආ) ක්ෂණික ලොතරැයිවලට අදාළ අරමුදල් බෙදා හැරීම

| | සෙවණ රු. 50/- | සෙවණ රු. 40/- | සමෘද්ධි රු. 50/- |
|---|---|---|---|
| ත්‍යාග | 53.00% | 53.00% | 53.00% |
| නියෝජිත කොමිස් | 18.75% | 18.75% | 18.75% |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිත කොමිස් | 1.25% | 1.25% | 1.25% |
| රජයට දායකත්වය | 10.00% | 10.00% | 10.00% |
| මණ්ඩලීය වියදම් | 17.00% | 17.00% | 17.00% |
| **එකතුව** | **100.00%** | **100.00%** | **100.00%** |

ඇ) ඒකාබද්ද අරමුදල හරහා අදාල අමාත්‍යංශවලට සිදු කරන ලද රජයේ දායකත්වය පහත පරිදි වේ.

| දිනුම් අදින ලොතරැයි | ප්‍රතිශතය (%) | ඒකාබද්ධ අරමුදල/අමාත්‍යංශ |
|---|---|---|
| මහජන සම්පත | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| ගොවිසෙත | 10% | ඒකාබද්ධ අරමුදල - කෘෂිකර්ම අමාත්‍යංශය |
| ලකී 7 (බදාදා) | 10% | ඒකාබද්ධ අරමුදල - සෞඛ්‍ය අමාත්‍යාංශය |
| ලකී 7 (සෙනසුරාදා සහ ඉරිදා) | 10% | ඒකාබද්ධ අරමුදල - කම්කරු අමාත්‍යාශය (ශ්‍රම වාසනා අරමුදල) |
| ලකී 7 (සඳුදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා) | 10% | ඒකාබද්ධ අරමුදල |
| ලකී 7(සිකුරාදා) | 10% | ජාතික වකුගඩු අරමුදල |
| මෙගා පවර් | 10% | ඒකාබද්ධ අරමුදල |
| ධන නිධානය | 10% | ඒකාබද්ධ අරමුදල |

| | | |
|---|---|---|
| හදහන (සදුදා, අඟහරුවාදා සහ බදාදා) | 10% | ඒකාබද්ධ අරමුදල - රණවිරු සේවා අධිකාරිය |
| හදහන (බ්‍රහස්පතින්දා, සිකුරාදා සෙනසුරාදා සහ ඉරිදා) | 10% | ඒකාබද්ධ අරමුදල - ක්‍රීඩා අමාත්‍යාංශය හා සමාජසේවා අමාත්‍යාංශය |
| අද සම්පත | 10% | ඒකාබද්ධ අරමුදල |
| **ක්ෂණික ලොතරැයි** | | |
| සෙවණ | 10% | ඒකාබද්ධ අරමුදල - නිවාස අමාත්‍යාංශය |
| සමෘද්ධි | 10% | ඒකාබද්ධ අරමුදල - සමෘද්ධි හා තරුණ කටයුතු අමාත්‍යාංශය |

### 2.6.7. ත්‍යාග ගිණුම්ගත කිරීම

1997 අංක 35 දරණ (සංශෝධිත) මුදල් පනතේ 5(1) පරිච්ඡේදය අනුව සහ 1998 අංක 22 දරණ (සංශෝධිත) මුදල් පනතේ අංක 7(2) පරිච්ඡේදයේ සඳහන් නීති ප්‍රකාරව අදාළ දිනුම්වාරයේ දිනා නොගත් ත්‍යාගවල වටිනාකම ඉන්පසු දිනුම් අදින ලොතරැයි වාරවල ත්‍යාග ගෙවීම සඳහා යොදා ගැනීමට මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ත්‍යාග සංචිත ගිණුමට බැර කර එකතු කරයි.

### 2.6.8 ඊ - ලොතරැයි

දිනුම් අදින ලොතරැයි සාමාන්‍ය අලෙවි නියෝජිත ජාලයට අමතරව කෙටිපණිවුඩ (SMS) මගින් අලෙවි කෙරේ.

### 2.6.9. ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු හා වැරදිවල වෙනස්කම්.

පහත සංශෝධිත ප්‍රමිතීන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.
ශ්‍රී.ලං.ගි.ප්‍ර. 03 - ව්‍යාපාර සංයෝජන (ව්‍යාපාර සඳහා නිර්වචනය)
ශ්‍රී.ලං.ගි.ප්‍ර. 17 - රක්ෂණ ගිවිසුම්

## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන් 03

| දළ පිරිවැටුම - එකතුකළ අගය මත බදු (VAT) ඇතුලත්ව | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| මහජන සම්පත | | 10,951,635,560 | 9,854,274,680 |
| ගොවිසෙත | | 5,657,611,280 | 5,094,203,960 |
| ජාතික සම්පත | | - | 1,096,931,360 |
| මෙගා පවර් | | 5,234,800,920 | 4,537,680,200 |
| ධන නිධානය | | 3,253,052,480 | 2,971,642,960 |
| හඳහන | | 5,497,416,080 | 6,034,965,800 |
| ලකී 7 | | 2,275,921,680 | 1,514,512,520 |
| අද සම්පත | | 4,782,718,760 | - |
| මෙගා මිලියන් | | - | 143,192,000 |
| මෙගා 60 | | - | 143,253,000 |
| මහජන සම්පත ජයකින් 5000 | | - | 170,892,800 |
| සමෘද්ධි | | 52,058,000 | 47,942,000 |
| සෙවණ - ක්ෂණික | | 277,992,000 | 404,710,000 |
| | | **37,983,206,760** | **32,014,201,280** |

සටහන් 04

| විකුණුම් පිරිවැය | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 04-01 | 836,737,406 | 1,186,907,181 |
| අලෙවි නියෝජිත කොමිස් | 04-02 | 7,121,851,268 | 6,002,662,740 |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිත කොමිස් | 04-03 | 474,790,085 | 524,263,381 |
| ත්‍යාග | 04-04 | 19,617,689,592 | 16,671,455,496 |
| රජයට දායකත්වය (විශේෂ බදු) | 04-05 | 4,510,176,987 | 3,841,947,982 |
| | | **32,561,245,336** | **28,227,236,781** |

සටහන් 04-01

| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ජනවාරි 01 දිනට ආරම්භක තොග ශේෂය | | | |
| දිනුම් අදින ලොතරැයි | | 6,899,988 | 14,296,425 |
| සෙවණ ලොතරැයිය | | 5,431,530 | - |
| සමෘද්ධි ලොතරැයිය | | 2,967,306 | - |
| | | 15,298,824 | 14,296,425 |
| | | | |
| එකතු කළා: වර්ෂය තුළ ටිකට්පත් මිලදී ගැනීම | | 837,419,855 | 1,187,909,580 |
| | | 852,718,679 | 1,202,206,005 |
| අඩු කළා: දෙසැම්බර් 31 දිනට අවසාන තොග ශේෂය | | | |
| දිනුම් අදින ලොතරැයිය | | 12,611,286 | 6,899,988 |
| සෙවණ ලොතරැයිය | | 3,369,988 | 5,431,530 |
| සමෘද්ධි ලොතරැයිය | | - | 2,967,306 |
| | | 15,981,274 | 15,298,824 |
| | | | |
| | | **836,737,406** | **1,186,907,181** |

සටහන් 04-02

| නියෝජිත කොමිස් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| මහජන සම්පත | | 2,053,431,668 | 1,847,676,503 |
| ගොවිසෙත | | 1,060,802,115 | 955,163,243 |
| ජාතික සම්පත | | - | 205,674,630 |
| මෙගා පවර් | | 981,525,173 | 850,815,038 |
| ධන නිධානය | | 609,947,340 | 557,183,055 |
| හඳහන | | 1,030,765,515 | 1,131,556,088 |
| ලකී 7 | | 426,735,315 | 283,971,098 |
| අද සම්පත | | 896,759,768 | - |
| මෙගා මිලියන් | | - | 26,848,500 |
| මෙගා 60 | | - | 26,859,938 |
| මහජන සම්පත ජයකින් 5000 | | - | 32,042,400 |
| සමෘද්ධි | | 9,760,875 | 8,989,125 |
| සෙවණ - ක්ෂණික | | 52,123,500 | 75,883,125 |
| | | **7,121,851,268** | **6,002,662,740** |

සටහන් 04-03

| දිස්ත්‍රික් නියෝජිත කොමිස් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| මහජන සම්පත | | 136,818,093 | 123,160,968 |
| ගොවිසෙත | | 70,721,350 | 63,648,956 |
| ජාතික සම්පත | | - | 13,703,300 |
| මෙගා පවර් | | 65,399,046 | 56,675,928 |
| ධන නිධානය | | 40,676,804 | 37,141,768 |
| හඳහන | | 68,705,113 | 179,500,719 |
| ලකී 7 | | 28,560,070 | 37,844,930 |
| අද සම්පත | | 59,783,985 | - |
| මෙගා මිලියන් | | - | 3,901,990 |
| මෙගා 60 | | - | 1,740,774 |
| මහජන සම්පත ජයකින් 5000 | | - | 2,109,720 |
| සමෘද්ධි | | 650,725 | 479,545 |
| සෙවණ - ක්ෂණික | | 3,474,900 | 4,354,785 |
| | | **474,790,085** | **524,263,381** |

සටහන් 04-04

| ත්‍යාග | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| මහජන සම්පත | | 5,277,943,509 | 4,849,466,042 |
| ගොවිසෙත | | 2,811,063,183 | 2,621,705,730 |
| ජාතික සම්පත | | - | 543,682,512 |
| මෙගා පවර් | | 2,543,205,480 | 2,140,883,033 |
| ධන නිධානය | | 1,654,825,230 | 1,508,636,940 |
| හඳහන | | 3,054,906,960 | 3,606,142,591 |
| ලකී 7 | | 1,329,912,450 | 863,271,381 |
| අද සම්පත | | 2,770,906,280 | - |
| මෙගා මිලියන් | | - | 109,764,000 |
| මෙගා 60 | | - | 126,109,500 |
| මහජන සම්පත ජයකින් 5000 | | - | 97,408,896 |
| සමෘද්ධි | | 27,590,740 | 24,737,260 |
| සෙවණ - ක්ෂණික | | 147,335,760 | 179,647,610 |
| | | **19,617,689,592** | **16,671,455,496** |

සටහන් 04-05

| රජයට කරන ලද දායකත්වය (විශේෂ බදු) | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | | | |
| මහජන සම්පත | | 1,807,019,867 | 1,625,955,322 |
| ගොවිසෙත | | 565,761,128 | 509,420,396 |
| ජාතික සම්පත | | - | 109,693,136 |
| මෙගා පවර් | | 523,480,092 | 453,768,020 |
| ධන නිධානය | | 325,305,248 | 297,164,296 |
| හඳහන | | 549,741,608 | 603,496,580 |
| ලකී 7 | | 195,337,952 | 147,272,520 |
| අද සම්පත | | 478,271,876 | - |
| මෙගා මිලියන් | | - | 14,319,200 |
| මෙගා 60 | | - | 14,325,300 |
| මහජන සම්පත ජයකින් 5000 | | - | 17,089,280 |
| සමෘද්ධි | | 5,205,800 | 4,794,200 |
| සෙවණ - ක්ෂණික | | 27,799,200 | 40,471,000 |
| | | **4,477,922,771** | **3,837,769,250** |
| ජාතික වකුගඩු අරමුදල සඳහා කරන ලද දායකත්වය | | | |
| ලකී 7 | | 32,254,216 | 4,178,732 |
| | | **32,254,216** | **4,178,732** |
| | | | |
| | | **4,510,176,987** | **3,841,947,982** |

සටහන් 05

| වෙනත් ආදායම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| පොලී ආදායම | | 715,227,589 | 1,194,699,827 |
| වෙනත් ආදායම් | | 224,025,725 | 128,049,341 |
| | | **939,253,314** | **1,322,749,168** |

සටහන් 06

| විකුණුම්, අලෙවි හා බෙදාහැරීම් වියදම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| බෙදාහැරීම් වියදම් | 06-01 | 370,792,590 | 532,775,998 |
| අලෙවිකරණ හා අලෙවි ප්‍රවර්ධන වියදම් | 06-02 | 756,053,030 | 834,358,916 |
| සන්නිවේදන වියදම් | 06-03 | 31,640,535 | 40,981,607 |
| | | **1,158,486,156** | **1,408,116,521** |

සටහන් 06-01

| බෙදාහැරීම් වියදම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| මෝටර් වාහන - ඉන්ධන (50%) | | 15,723,848 | 22,033,682 |
| මෝටර් වාහන - අළුත්වැඩියාව හා නඩත්තුව (50%) | | 16,452,652 | 9,913,316 |
| මෝටර් වාහන - රක්ෂණ (50%) | | 685,621 | 665,755 |
| මෝටර් වාහන - ආදායම් බලපත්‍ර (50%) | | 540,702 | 209,258 |
| මෝටර් වාහන - ටයර් හා ටියුබ් (50%) | | 1,972,954 | 1,527,462 |
| මෝටර් වාහන - නඩත්තු හා වෙනත් (50%) | | 3,606,880 | 4,147,674 |
| මෝටර් වාහන - ක්ෂය කිරීම (50%) | | 480,988 | 458,311 |
| ටිකට්පත් ප්‍රවාහන වියදම් | | 37,438,432 | 43,902,791 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම් | | (901,639) | 4,697,428 |
| නියෝජිත සහන වියදම් හා ආපසු භාරදෙන ටිකට්පත්වල පිරිවැය | | 120,615 | 131,930 |
| දි. අලෙවි නියෝජිත හා අලෙවි නියෝජිත පුහුණු වියදම් හා රැස්වීම් | | 687,238 | 3,265,954 |
| නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | | 1,455,500 | 1,016,500 |
| නියෝජිත සහ අලෙවි සහායක වෛද්‍ය හා රක්ෂණ වියදම් | | 15,961,000 | 18,191,000 |
| නියෝජිත අතිරේක අලෙවි ප්‍රවර්ධන වියදම් | | 271,855,746 | 418,526,937 |
| දිනුම්ලාභීන් බිහිකළ අලෙවි නියෝජිතවරු ඇගයීම | | 4,161,000 | 4,083,500 |
| අලෙවි නියෝජිත සහ අලෙවි සහායක සුභසාධනය | | 551,055 | 4,500 |
| | | **370,792,590** | **532,775,998** |

සටහන් 06-02

| අලෙවිකරණ හා අලෙවි ප්‍රවර්ධන වියදම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| නිෂ්පාදන හා විකාශන ගාස්තු | | 499,124,600 | 523,318,217 |
| ලොතරැයි ප්‍රතිඵල ප්‍රචාරණය | | 36,884,615 | 61,022,462 |
| වෙළඳනාම ප්‍රවර්ධන ප්‍රචාරණය | | 131,734,197 | 156,330,755 |
| ප්‍රතිරූප ප්‍රවර්ධන ප්‍රචාරණය | | 20,527,965 | 42,480,422 |
| ආයතනික සමාජීය වගකීම | | 8,046,400 | 4,655,000 |
| BTL ප්‍රචාරණ වියදම් | | 5,000,000 | 18,638,975 |
| අලෙවි නියෝජිතයින්ට අලෙවි කුටි හා වෙනත් දේ | | 54,735,254 | 27,913,085 |
| | | **756,053,030** | **834,358,916** |

සටහන් 06-03

| සන්නිවේදන වියදම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| තැපැල් හා විදුලි පණිවිඩ (60%) | | 482,699 | 447,938 |
| දුරකථන, ෆැක්ස් හා අන්තර්ජාල (60%) | | 11,247,343 | 12,241,040 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය (60%) | | 19,381,331 | 27,017,096 |
| පුවත්පත් දැන්වීම (60%) | | 529,162 | 1,275,533 |
| | | **31,640,535** | **40,981,607** |

සටහන් 07

| ආයතනික හා පරිපාලන වියදම් | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| සේවක දීමනා | 07-01 | 717,325,811 | 664,228,905 |
| ආයතනික වියදම් | 07-02 | 163,081,305 | 141,548,554 |
| වෙනත් පරිපාලන වියදම් | 07-03 | 247,767,499 | 251,142,757 |
| | | **1,128,174,614** | **1,056,920,215** |

සටහන් 07-01

| සේවක දීමනා | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| සේවක වැටුප් | | 250,605,815 | 210,229,783 |
| සේවක අතිකාල | | 34,922,638 | 40,442,574 |
| විශේෂ රාජකාරි දීමනාව | | 1,527,288 | 1,599,403 |
| සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය | | 34,350,534 | 28,163,545 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වය | | 6,870,107 | 5,624,787 |
| සේවක විශ්‍රාම වැටුප් | | 238,159 | 211,464 |
| සේවක වාර්ෂික ප්‍රසාද දීමනාව | | 30,000,000 | 24,402,489 |
| නිවාඩු ප්‍රතිපූර්ණ දීමනා | | 7,492,149 | 8,154,073 |
| අවදානම් දීමනාව | | 1,132,200 | 1,095,000 |
| සේවක සුබසාධන වියදම් | | 42,924,147 | 44,956,975 |
| සේවක නිල ඇඳුම් | | 8,465,748 | 9,167,456 |
| සේවක පාරිතෝෂික වියදම් | 24 | 17,156,070 | 19,498,310 |
| සුබසාධන සහ සකසුරුවම් අරමුදල් දායකත්වය | | 9,601,684 | 7,058,387 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා | | 1,473,333 | 1,496,118 |
| විකුණුම් දිරිදීමනා | | 143,866,396 | 119,082,649 |
| අමතර සහන ගෙවීම් | | 39,747,832 | 38,260,866 |
| සේවක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ගමන් වියදම්, යැපීම සහ විශේෂ දීමනාව | | 41,703,310 | 40,366,325 |
| ඉලක්ක පදනම් වූ සේවක අභිප්‍රේරණ ප්‍රතිලාභ දිරිදීමනා | | 35,816,328 | 15,266,800 |
| ජංගම අලෙවි ප්‍රචාරක රථ සේවක - රාජකාරි දීමනාව | | 4,708,000 | 2,936,000 |
| සේවකයින් සඳහා ත්‍යාග | | - | 41,656,500 |
| නිවාස ණය මත සේවක ප්‍රතිලාභ | | 4,724,072 | 4,559,403 |
| | | **717,325,811** | **664,228,905** |

සටහන් 07-02

| ආයතනික වියදම් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| කුලිය | | 87,686,550 | 87,926,550 |
| අනුපාත සහ බදු | | 30,270 | 65,370 |
| විදුලිය | | 21,252,250 | 20,604,371 |
| ජලය | | 1,431,514 | 1,383,295 |
| පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම | | 10,898,447 | 9,913,650 |
| ගොඩනැගිල්ල - අලුත්වැඩියා කිරීම | | 38,720 | 73,300 |
| වාහන හැර අනෙකුත් නඩත්තු | | 8,592,908 | 293,046 |
| වාහන හැර අනෙකුත් අලුත්වැඩියාවන් | | 3,287,757 | 5,172,912 |
| වාහන හැර වෙනත් රක්ෂණ | | 599,912 | 670,359 |
| වාහන හැර අනෙකුත් ක්ෂයවීම් | | 26,610,865 | 13,972,078 |
| ආයෝජන දේපල ක්ෂය කිරීම | | 2,485,500 | 1,473,622 |
| | | **163,081,305** | **141,548,554** |

සටහන් 07-03

| වෙනත් පරිපාලන වියදම් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| බාහිර විගණන ගාස්තුව | | 2,700,000 | 2,440,500 |
| නීති ගාස්තු | | 10,098,470 | 2,203,238 |
| විදේශ සංචාර | | 456,363 | - |
| පුවත්පත් සහ සඟරා | | 250,000 | 844,670 |
| අලුත් කිරීමේ ගාස්තුව - අන්තර් ජාතික ලොතරැයි සංගමය | | 1,653,345 | 1,741,713 |
| මෝටර් වාහන - ඉන්ධන (50%) | | 15,723,848 | 22,033,682 |
| මෝටර් වාහන - අළුත්වැඩියා (50%) | | 16,452,652 | 9,913,316 |
| මෝටර් වාහන - රක්ෂණ (50%) | | 685,621 | 665,755 |
| මෝටර් වාහන - ආදායම් බලපත්‍ර (50%) | | 540,702 | 209,258 |
| මෝටර් වාහන - ටයර් හා ටියුබ් (50%) | | 1,972,954 | 1,527,462 |
| මෝටර් වාහන - නඩත්තු හා වෙනත් (50%) | | 3,606,880 | 4,147,674 |
| මෝටර් වාහන - ක්ෂය කිරීම් (50%) | | 480,988 | 458,311 |
| පරිභෝජිත කළ නොහැකි අයිතම | | 1,631,696 | 1,887,016 |
| පාරිභෝජිත භාණ්ඩ | | 1,591,916 | 1,765,051 |
| අහඹු සහ සාමාන්‍ය වියදම් | | 3,599,832 | 13,367,066 |
| දිනුම් ටිකට්පත් පරීක්ෂා කිරීම | | 164,430 | 161,690 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වියදම් | | 273,585 | 318,435 |
| පුහුණු හා සම්මන්ත්‍රණ ගාස්තු | | 1,074,819 | 1,667,980 |
| සංචාරක බංගලා අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | | 380,852 | 1,601,778 |
| උපදේශන සහ වෘත්තීය ගාස්තු | | 1,909,123 | 3,639,082 |
| ත්‍යාග නිශ්කාශන කිරීමේ ගාස්තු | | 14,247,734 | 17,813,843 |
| වෛද්‍ය වියදම් - කාර්ය මණ්ඩලය | | 99,650,000 | 88,150,000 |
| කාර්ය මණ්ඩල හදිසි අනතුරු රක්ෂණය සහ වන්දි ගෙවීම | | 2,000,000 | 2,000,000 |
| වාහන කුලී ගාස්තු | | 9,886,500 | 10,029,750 |
| මෘදුකාංග නඩත්තුව | | 12,512,847 | 13,948,016 |
| ආහාරපාන වියදම් - අධ්‍යක්ෂ මණ්ඩලය | | 224,455 | 258,900 |
| ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයින් සඳහා ගාස්තු | | 407,500 | 800,000 |
| ලොතරැයි විගණන ගාස්තුව | | 22,496,700 | 20,227,500 |
| තැපැල් ගාස්තු සහ විදුලි පණිවුඩ (40%) | | 321,799 | 298,625 |
| දුරකථන, ෆැක්ස් සහ අන්තර්ජාලය (40%) | | 7,498,229 | 8,160,694 |
| මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය (40%) | | 12,920,887 | 18,011,397 |
| පුවත්පත් දැන්වීම් (40%) | | 352,775 | 850,356 |
| | | **247,767,499** | **251,142,757** |

සටහන් 08

| මූල්‍ය හා වෙනත් වියදම් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| බැංකු ගාස්තු | | 3,236,575 | 8,089,838 |
| පැරණි ශේෂයන් නිවැරදි කිරීම සහ ලියා හැරීම | | 212,113 | 1,455,528 |
| අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල නැවත තක්සේරු කිරීමේ පාඩුව | | - | 581,103 |
| ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ප්‍රාග්ධන කටයුතු සඳහා අපහායන ප්‍රතිපාදන | | - | 27,178,359 |
| | | 6,004 | - |
| | | **3,454,692** | **37,304,827** |

සටහන් 09

| ආදායම් බදු වියදම් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| වර්තමාන වසරේ ආදායම් බදු | | 127,122,510 | 153,274,709 |
| පසුගිය වසරේ ආදායම් බදු - නිවැරදි කිරීම් සහ ගැලපීම් | | 54,188,242 | 38,769,324 |
| විලම්භිත බදු ආපසු හැරවීම | | 7,754,291 | 1,931,382 |
| ආදායම් බදු වියදම් | | **189,065,042** | **193,975,415** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා සටහන්

සටහන් 10 - දේපල පිරියත හා උපකරණ - නිදහස් බදු දේපල

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | මෝටර් රථ රු. | පරිගණක හා උපාංග රු. | කාර්යාල උපකරණ රු. | දිනුම් ඇදීමේ යන්ත්‍ර රු. | ලී බඩු හා සවිකිරීම් රු. | ප්‍රවර්ධන උපකරණ රු. | 2024 එකතුව රු. | 2023 එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය හෝ ප්‍රත්‍යාගනිත වටිනාකම** | | | | | | | | | | |
| **වර්ෂය ආරම්භයේ ශේෂය** | 1,008,450,000 | 50,965,000 | 275,810,109 | 145,902,680 | 61,079,671 | 162,980,392 | 39,486,680 | 13,389,940 | 1,758,064,472 | 1,215,002,574 |
| ප්‍රත්‍යාගණන ගැලපීම | - | - | - | - | - | - | - | - | - | 536,083,680 |
| වර්ෂය තුළ එකතුකිරීම් | - | - | - | 2,749,200 | 3,521,883 | 258,678,758 | 519,248 | - | 265,469,089 | 6,978,218 |
| වර්ෂය තුළ විකුණුම් | - | - | (1,057,000) | (770,900) | (1,005,202) | - | - | - | (2,833,102) | - |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **1,008,450,000** | **50,965,000** | **274,753,109** | **147,880,980** | **63,596,352** | **421,659,149** | **40,005,928** | **13,389,940** | **2,020,700,459** | **1,758,064,472** |
| | | | | | | | | | | |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | | | | | | | | | |
| **වර්ෂය ආරම්භයේ ශේෂය** | - | 635,604 | 273,411,124 | 136,332,413 | 52,193,996 | 162,980,392 | 29,780,032 | 13,389,940 | 668,723,501 | 664,495,767 |
| ප්‍රත්‍යාගණන ගැලපීම | - | - | - | - | - | - | - | - | - | (10,660,967) |
| වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | 2,548,250 | 961,975 | 5,170,091 | 3,291,475 | 12,933,938 | 2,667,112 | - | 27,572,840 | 14,888,701 |
| විකුණුම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | | (1,057,000) | (770,900) | (518,090) | - | - | - | (2,345,990) | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **-** | **3,183,854** | **273,316,099** | **140,731,604** | **54,967,381** | **175,914,329** | **32,447,144** | **13,389,940** | **693,950,351** | **668,723,501** |
| | - | | | | | | | | | |
| **2024.12.31** දිනට ධාරණ වටිනාකම | **1,008,450,000** | **47,781,146** | **1,437,010** | **7,149,376** | **8,628,971** | **245,744,820.01** | **7,558,784** | **-** | **1,326,750,107** | |
| **2023.12.31** දිනට ධාරණ වටිනාකම | **1,008,450,000** | **50,329,396** | **2,398,985** | **9,570,267** | **8,885,675** | **-** | **9,706,648** | **-** | | **1,089,340,971** |
| ක්ෂය අනුපාතය | **-** | **05%** | **25%** | **25%** | **20%** | **20%** | **10%** | **33.33%** | | |

**ඉඩම - වොක්ෂෝල් වීදිය**

**ගොඩනැගිලි - නාරාහේන්පිට සභාපතිගේ බංගලාව සහ වොක්ෂෝල් ගොඩනැගිල්ල**

